# 2025

## වාර්ෂික කාර්යය සාධන වාර්තාව හා ගිණුම්

## வருடாந்த செயலாற்று அறிக்கை மற்றும் கணக்கறிக்கை

# Annual Performance Reports & Accounts





Designed : Satheeswaran (DO), Dist.sec Ampara

## දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - අම්පාර

## மாவட்ட செயலகம் – அம்பாறை

## District Secretariat – Ampara

# අම්පාර දිසාපතිතුමාගේ පණිවුඩය



විකසිත ප්‍රජාවකින් හෙබි ඉසුරුපිරි දිස්ත්‍රික්කයක් බිහි කිරීමේ අරමුණ පෙරදැරිව ක්‍රියාත්මක අම්පාර දිස්ත්‍රික්කයේ පරිපාලනයේ කේන්ද්‍රස්ථානය වන, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් 2025 වර්ෂයේ ඉටු කරනු ලැබූ සේවාවන් හා සිදු කරන ලද ව්‍යාපෘතීන් කේන්ද්‍ර කොට ගනිමින් 2002.09.12 දිනැති අංක 402 දරණ රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛයට අනුව, අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්හී මූල්‍ය පාලනය පාදක කර ගනිමින් වාර්ෂික කාර්ය සාධන වාර්තාව සකස් කර ඇත.

ශ්‍රී ලංකාවේ නැගෙනහිර පළාතේ ප්‍රධාන පරිපාලන දිස්ත්‍රික්කයක් මෙන්ම වැදගත්කමක් උරුම කරගත් දිස්ත්‍රික්කයක් වන අතර, කෘෂිකාර්මික, ධීවර, වාණිජ, සංචාරක හා කාර්මික ක්ෂේත්‍රවලින් ජාතික ආර්ථිකයට මහත් දායකත්වයක් සපයන ප්‍රදේශයක් වේ. විවිධ ජන වර්ග, ආගමික හා සංස්කෘතික පසුබිම් ඇති ජනතාව සමඟ බහු සංස්කෘතික සමාජයක් සඳහා ද අම්පාර දිස්ත්‍රික්කය විශේෂ භූමිකාවක් ඉටු කරයි.

ඓතිහාසික දිගාමඩුලු පුරවරයේ උරුමයන් හා විභවතාවය දරා සිටින, දීඝවාපිය හා රජගල වැනි ඓතිහාසික පුදබිම් සිට සුන්දර වූ ආරුගම්බේ මුහුදු තීරය දක්වා විහිදුනු සංස්කෘතික හා පාරිසරික සන්සිද්ධීන් අම්පාර දිස්ත්‍රික්කය දෙස් විදෙස් සංචාරක ආකර්ෂණයේ කේන්ද්‍රස්ථානයක් බවට පත් කර ඇත. කෘෂිකාර්මික හා ධීවර කර්මාන්තය තුලින් රටෙහි ජාතික නිෂ්පාදනයට සිදු කරන දායකත්වයද අති මහත්ය. අප දිස්ත්‍රික්කය සතු අධ්‍යාපනික හා තාක්ෂණික ආයතන පද්ධතිය හරහා මානව සම්පත ගුණාත්මකව වර්ධනය වන අතර, 2025 වසර තුළ අප හමුවේ පැවති මූල්‍ය අභියෝග හමුවේ වුවද, විකල්ප ක්‍රමෝපායන් සහ නව්‍ය කළමනාකරණ ශිල්පීය ක්‍රම අනුගමනය කරමින් රාජ්‍ය ප්‍රතිපත්තිවලට අනුගත වෙමින් අපේක්ෂිත ඉලක්ක සපුරා ගනිමින් සංවර්ධනයට කටයුතු සිදු කිරීම, Clean Sri Lanka වැනි ජාතික වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, "අස්වැසුම" වැනි සමාජ සුබසාධනය වැඩසටහන් මඟින් ජනතාවගේ ජීවන තත්ත්වය නඟා සිටුවමින්, උඳු, මුං වැනි භෝග වගා ප්‍රවර්ධනය හරහා ග්‍රාමීය ජීවනෝපායන් තුලින් ආර්ථික ස්ථායීතාව ඇති කිරීමට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය ඉමහත් දායකත්වයක් සපයයි.

මෙම වාර්තාව තුළ දිස්ත්‍රික් පරිපාලනය යටතේ ක්‍රියාත්මක වූ සංවර්ධන ව්‍යාපෘති, සමාජ සුභසාධන වැඩසටහන්, පරිපාලන හා සංවර්ධන වියදම්, ආදායම් කළමනාකරණය සහ රාජ්‍ය අරමුදල් භාවිතයේ කාර්යක්ෂමතාව පිළිබඳ සවිස්තරාත්මක තොරතුරු ඇතුළත් කර ඇත.

රජයේ මූල්‍ය නීති, නියාමන හා මාර්ගෝපදේශයන්ට අනුගතව, වගකීමෙන් සහ විනිවිදභාවයෙන් මූල්‍ය කළමනාකරණය ක්‍රියාත්මක කිරීම දිස්ත්‍රික් පරිපාලනයේ ප්‍රධාන වගකීමක් ලෙස සැලකිය හැකි අතර, එම අරමුණ සාර්ථකව ඉටු කිරීම සඳහා සියලුම අංශ හා ආයතන සමඟ සමීපව කටයුතු කරන ලදී. මෙහි සඳහන් අරමුණු හා ඉලක්ක සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය අනුශාසකත්වය ලබාදුන් සර්ව ආගමික නායකයින්ටද සහයෝගය ලබාදුන් දේශපාලන අධිකාරියද එයට අමතරව මෙම කර්තව්‍යයන් උදෙසා අප හා සම්බන්ධ වූ අම්පාර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම්වරු ඇතුළු ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල කාර්ය මණ්ඩල හා අනෙකුත් රාජ්‍ය, අර්ධ රාජ්‍ය, රාජ්‍ය නොවන සංවිධානවල ප්‍රධානීන් සහ කාර්ය මණ්ඩල, සිවිල් සමාජ සංවිධාන, ග්‍රාමීය කමිටු යනාදීය ද ඉතා කෘතඥ පූර්වකව සිහිපත් කරමි. තවද දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අතිරේක දිස්ත්‍රික් ලේකම්වරු ඇතුළු සියලුම මාණ්ඩලික නිලධාරීන් හා කාර්ය මණ්ඩලයටද මාගේ ප්‍රශංසාව පළ කරමි.

එමෙන්ම මෙම වාර්තාව සකස් කිරීම සඳහා දායක වූ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රධාන ගණකාධිකාරී හා ගණකාධිකාරී ඇතුළු සියලුම මූල්‍ය අංශයේ කාර්ය මණ්ඩලයට සහ මේ හා සම්බන්ධ සියලු පාර්ශවකරුවන්ට ස්තූතිය පළ කරමි. දිස්ත්‍රික්කයේ මහජනතාවගේ ජීවන තත්ත්වය උසස් කරමින්, තිරසාර සංවර්ධනය සඳහා කාර්යක්ෂම මූල්‍ය කළමනාකරණයක් සහ උසස් මහජන සේවාවක් සැපයීමට අපගේ කැපවීම තවදුරටත් ශක්තිමත් කරමින් කටයුතු කරමි.

දිස්ත්‍රික්කයේ සමාජ, ආර්ථික හා භෞතික සංවර්ධනය තිරසාර ලෙස ප්‍රවර්ධනය කිරීම සහ මහජන සේවාවන් කාර්යක්ෂමව හා විනිවිදභාවයෙන් සැපයීම අරමුණ කරගනිමින්, 2025 වසර තුළ සිදුකළ මූල්‍ය කළමනාකරණ ක්‍රියාවලිය පිළිබඳ මෙම වාර්ෂික කාර්ය සාධන වාර්තාව මෙසේ ඉදිරිපත් කරමි.

චින්තක අබේවික්‍රම,
දිසාපති/ දිස්ත්‍රික් ලේකම්,
අම්පාර දිස්ත්‍රික්කය.

පටුන

**01. පරිච්ඡේදය - ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය ....................................1**
**1.1 හැඳින්වීම ....................................1**
**විකසිත ප්‍රජාවකින් හෙබි ඉසුරුපිරි දිස්ත්‍රික්කයක් - අම්පාර දිස්ත්‍රික්කය ....................................1**
**1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු ....................................4**
**1.3 ප්‍රධාන කාර්යයන් ....................................5**
**1.4 සංවිධාන සටහන - දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, අම්පාර ....................................6**
**1.5 දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා අනුබද්ධිත ආයතන ....................................7**
**1.6 අමාත්‍යාංශ/දෙපාර්තමේන්තුව/පළාත් සභාව යටතේ පවතින ආයතන ....................................8**
**1.7 විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු (තිබේ නම්) ....................................8**
**02. පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම ....................................9**
**03 පරිච්ඡේදය - 2025දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ථ මූල්‍ය කාර්ය සාධනය ....................................13**
**3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය ....................................13**
**3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය ....................................14**
**3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය ....................................15**
**3.4 මූල්‍ය ප්‍රකාශ සටහන් ....................................16**
**3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය ....................................34**
**3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය ....................................35**
**3.7 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන ....................................36**
**3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය ....................................41**
**3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව ....................................42**
**04. පරිච්ඡේදය - කාර්ය සාධන දර්ශක ....................................61**
**4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව) ....................................61**
**05. පරිච්ඡේදය - තිරසාර සංවර්ධන ඉලක්ක (SDG) සාක්ෂාත් කර ගැනීමේ කාර්යය සාධනය62**
**5.1 හඳුනා ගන්නා ලද තිරසර සංවර්ධන අරමුණු දක්වන්න ....................................62**
**5.2 ළඟා කරගත් තිරසර සංවර්ධන ඉලක්ක ළඟා කර ගැනීම හා එහිදී මුහුණ දුන් අභියෝග කෙටියෙන් විස්තර කරන්න. ....................................73**
**06 පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ ....................................74**
**06.1 සේවක සංඛ්‍යා කළමනාකරණය ....................................74**
**06.2 ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයට බලපෑම ....................................74**
**06.3 මානව සම්පත් සංවර්ධනය ....................................75**
**07. පරිච්ඡේදය – අනුකූලතා වාර්තාව ....................................76**

# 01. පරිච්ඡේදය - ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය

## 1.1 හැඳින්වීම

### <u>විකසිත ප්‍රජාවකින් හෙබි ඉසුරුපිරි දිස්ත්‍රික්කයක් - අම්පාර දිස්ත්‍රික්කය</u>

පැරණි දිගාමඩුලු ජනපදයට අයත් වූ වර්තමාන අම්පාර දිස්ත්‍රික්කය ශ්‍රී ලංකාවේ නැගෙනහිර පළාතේ ස්ථානගතව ඇත. මෙහි භූමිය තැනින් තැන පිහිටි ශේෂ කඳුවලින් යුක්ත තැනිතලාවකි. මේ තැනිතලාව මුහුදු මට්ටමේ සිට සාමාන්‍යයෙන් අඩි 200 දක්වා ද හෙල් මුදුන්වල අඩි දහස දක්වා ද උස්ව පිහිටියේය. මේ සැබවින්ම සියල් සරින් පිරි බිම් කඩෙකි. ඈත ඌවේ කඳුකරය පශ්චාත් භාග කොට ගත් අඳුරු වන තීරයෙන් ආරම්භ වී මෑත වෙරළ තීරය තෙක්ම එක එල්ලේ විහිදී ගිය මනහර වෙල්යායෙකි. එය පෙර රජ දවස දකුණු දිග වෙරළ තීරය දක්වාම පැතිර පැවතියෙකි. මේ පෙදෙසේ සිත්කළු දර්ශනය ඍතුවෙන් ඍතුව වෙනස් වෙස් ගෙන බැබළෙති. වැසි කලට නිබඳ දියෙන් පිරීගත් කලපුවක සිරි ගන්නේය. ඊසාන මෝසම දුර්වල වෙද්දී පළාවන් ගොයමින් වැසි හරිත සමුද්‍රයක ශෝභාව පාන්නේය. ගොයම වැඩෙද්දී සිංහල ,දෙමළ හා මුස්ලිම් ගොවි දනන්ගේ පැල් වෙල් යායේ තැනින් තැන පැන නැග එයි. කුඹුර පැසෙද්දී ඈත වන තීරයෙන් එළි බැස එන අලින්, ඌරන්, මොණරුන් වැනි වන සතුන් මතු වෙයි. නැවත අස්වනු අස් කොට ගත් පසු මේ භූමිය එළ, මී, ගවයින් සිය ගණනින් සැදී රංචු සැරිසරන සුන්දර දර්ශනයක් මවයි. වියළි අගෝස්තුව වන විට දීප්ත සූර්ය රශ්මියෙන් පොළව දා ගිය කල සතෙකුට තණපතක් දිය බිඳක් නැති කර්කශ, වේගවත් මාරුතයෙන් උඩ නැගී කැරකෙන දූවිල්ලෙන් වැසුණු බිමක් බවට පෙරළේ.

මඩකලපුව දිසාපතිවරයා යටතේ රටේ මහත්තුරුන් විසින් පරිපාලන රාජකාරි සිදු කරන ලද මෙම බිම් කඩෙහි 1924 දී වැව්ගම්පත්තුව නමින් නව පරිපාලන ඒකකයක් ස්ථාපිත විය. වැත්තෑවේ රටේ මහත්තයා එහි පළමු රටේ මහත්තයා වූ අතර, පැරණි වාරිමාර්ග නැවත පිළිසකර කිරීමේ කටයුතු වේගවත්ව එම කාලය තුළ දී සිදුව ඇත. එලෙස ඇරඹි සංවර්ධනයේ කූඨප්‍රාප්තිය සනිටුහන් කරමින් ඩී.එස්.සේනානායක ශ්‍රීමතාණන්ගේ මෙහයවීමෙන් ගල්ඔය සංවර්ධන ව්‍යාපාරය දියත් විය. එම ගොවි ජනපද ව්‍යාපාරයේ අනගිතම නිමවුම අම්පාර දිස්ත්‍රික්කයයි. වැව්ගම්පත්තුව, බින්තැන්නපත්තුව, පානම්පත්තුව, සම්මන්තුරේපත්තුව, නින්දවූර්පත්තුව, අක්කරපත්තුව ඇතුළු පැරණි පරිපාලන ඒකක එකතු කර 1961 වර්ෂයේදී අම්පාර නමින් වෙනම පරිපාලන දිස්ත්‍රික්කයක් ස්ථාපිත විය. 1961 අප්‍රේල් 10 දින ජේ.ඩී.එස්.ඩී ලියනගේ මහතා මෙහි පළමු දිසාපතිවරයා ලෙස පරිපාලන රාජකාරි ඇරඹීය. 80 දශකයේදී මහවැලි සංවර්ධන ව්‍යාපාරය යටතේ මහවැලි සී කලාපය හෙවත් දෙහිඅත්තකණ්ඩිය ප්‍රදේශය ද මෙම දිස්ත්‍රික්කයට එක් විය. වර්තමාන අම්පාර දිස්ත්‍රික්කය සම්මන්තුර ,කල්මුණ, පොතුවිල්, අම්පාර යන ඡන්ද ප්‍රදේශ 04 ක්, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 19ක් හා උප ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක්, ග්‍රාම නිලධාරී වසම් 503 ක් හා ගම්මාන 614 කින් සමන්විතය. ඒ අතර, මහනගර සභා 02 ක් නගර සභා 01 ක් ප්‍රාදේශීය සභා 17 ක් හා පොලිස් ස්ථාන 14 ක් පවතී. කිලෝමීටර් 115 ක් පුරා දිවෙන දර්ශනීය වෙරළ තීරය ද, තැනින් තැන පිහිටි ශේෂ කඳු ද, ගමින් ගම පිහිටි නිල්දිය පිරි මහ වැව් ද, ඒ වැව් ඔස්සේ පීදෙන හරිත වෙල් යාය ද, වන සතුන් නිදහසේ සරනා වන ගොමු ද, මෙම දිස්ත්‍රික්කයේ සුන්දරත්වය සේම වටිනාකම ද ඉහළ නංවයි. දිස්ත්‍රික්කයේ බහු ආගමික, බහු සංස්කෘතික උරුමයන් විදහා දක්වමින් විහාරස්ථාන 223 ක් ද, හින්දු කෝවිල් 203 ක් ද, මුස්ලිම් පල්ලි 369 ක් හා ක්‍රිස්තියානි පල්ලි 74 ක් ද පවති.

ජන සංඛ්‍යා ලේඛණ දත්තවලට අනුව (දිස්ත්‍රික් සංඛ්‍යා ලේඛණ 2024) අම්පාර දිස්ත්‍රික්කයේ ජනගහනය සමස්ථ ජනගහනය 744,551 කි. පවුල් සංඛ්‍යාව 202,861 ක් වේ. මෙම සමස්ථ ජනගහනය තුළ 45.6% ක් මුස්ලිම් ජනතාව ද, 37.1% ක් සිංහල ජනතාව ද 16.1% ක් දෙමළ ජනතාවගෙන් හා 0.4% ක් අනෙකුත් ජනතාව ද නියෝජනය වන අතර, මෙම සියලු ජාතීන් සමඟියෙන් හා සහජීවනයෙන් ජීවත් වෙති.

මෙම දිස්ත්‍රික්කයේ වපසරිය වර්ග කිලෝමීටර් 4,415 ක් වේ. මෙහි සමස්ථ වගා බිම් ප්‍රමාණය වර්ග කිලෝමීටර් 1,264.47 කි. අභ්‍යන්තර ජලාශ ලෙස වර්ග කිලෝමීටර් 328.03 ද වනාන්තර ප්‍රමාණය (Forest & Range Land) වර්ග කිලෝමීටර් 2,097.53 ක් ද වේ. මෙහි වාර්ෂික වර්ෂාපතනය මිලිමීටර් 1,886 ක් පමණ වන අතර, සාමාන්‍ය උෂ්ණත්වය සෙල්සියස් අංශක 29.81 ක මට්ටමේ පවතී.

දිවයිනේ විශාලතම ජලාශය වන සේනානයක සමුද්‍රය ආශ්‍රිත වාරි පද්ධතිය මඟින් පෝෂණය වෙමින් ශ්‍රී ලංකාවේ ජාතික වී නිෂ්පාදනයෙන් 22.5% ක් දැයට උරුම කරමින් කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ '' ජාතියේ වී බිස්ස" යන විරුදාවලිය ලත් අම්පාර දිස්ත්‍රික්කය උක් වගාව, අතිරේක බෝග වගාව, පශු සම්පත් සහ

සාර්ථක කරදිය හා මිරිදිය ධීවර කර්මාන්තය තුළින් ජාතික ආහාර නිෂ්පාදනයේ ප්‍රමුඛස්ථානය හිමි කරගෙන ඇත.

විශ්ව විද්‍යාලයක්, උසස් තාක්ෂණ ආයතන, අධ්‍යාපන විද්‍යා පීඨයක්, තාක්ෂණික විද්‍යාල, වෘත්තීය පුහුණු ආයතන මෙන්ම ජාතික පාසල් ඇතුළු දියුණු පාසල් පද්ධතියකින් සන්නද්ධව අධ්‍යාපන ක්ෂේත්‍රයේ ඉහළ ගුණාත්මක වර්ධනයක් ඇති කර ගැනීමට අම්පාර දිස්ත්‍රික්කය සමත් වී ඇත. ජාතික හා ජාත්‍යන්තර මට්ටමෙන් ඵලදායිතා සම්මානයන්ගෙන් පිදුම් ලත් සෞඛ්‍ය සේවයක් දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක වීම ගොවි ජනයා ප්‍රමුඛ ප්‍රදේශවාසීන්ට මහත් අස්වැසිල්ලක් වී ඇත.

පාරිසරික වශයෙන් ආකර්ෂණීය වූ ගල්ඔය ජාතික වනෝද්‍යානය, කුමන ජාතික කුරුලු උයන, ලාහුගල ජාතික වනෝද්‍යානය, ආරුගම්බේ සර්ෆින් මුහුදු තීරය මෙන්ම, සංස්කෘතිකමය වශයෙන් වැදගත් වූ රජගල, දීඝවාපිය, මගුල් මහා විහාරය, බුද්ධංගල, ඔකඳ දේවාලය , කඩක්කරෙ පල්ලිය යනාදියෙන් ද සමන්විත වීම නිසා දෙස් විදෙස් සංචාරයන්ගේ පාරාදීසයක් බවට පත්ව ඇත.

## අම්පාර දිස්ත්‍රික්කයේ ඓතිහාසික පසුබිම

පුරාණ ලංකාව රුහුණු,මායා,පිහිටි යනුවෙන් රාජ්‍යයන් තුනක් වශයෙන් පැවතුණි. රුහුණු රාජධානියේ ඉතා වැදගත් දනව්වක් වශයෙන් සැලකූ දීඝවාපී හෙවත් දිගාමඩුලු රාජධානියේ ඉතිහාසය බුද්ධ කාලය දක්වා ඈතට යන බව ඓතිහාසික තොරතුරු වලින් සනාථ වෙයි. වංශ කථාවන්ට අනුව විජය ලංකාවට ගොඩබසින ලද්දේ බුදුරජාණන් වහන්සේගේ පිරිණිවන් පෑම සිදුවූ දිනයේය. මණිඅක්ඛිත නා රජුගේ ඇරයුමෙන් බුදුරජණන් වහන්සේගේ තුන්වන වරට ලක්දිවට වැඩම කරන ලද කල්‍යාණ ගමනේදී දීඝවාපියට වැඩම කරවීම ගැන සඳහන් වේ.

අම්පාර ප්‍රදේශය ආර්ය ජනාවාසයක් බවට පත්වී ඇත්තේ විජය රජුගෙන් පසු පාලකයා බවට පත්වූ පඬුවස් දෙව් රජුගේ අවධියේය. පඬුවස් දෙව් රජුගේ බිසව වන භද්දකච්චායනා කුමරිගේ සහෝදරයකු වූ දීඝායු කුමරු විසින් පිහිටුවන ලද දීඝායුගාම පසුව දීඝවාපී,දිගාවැව හා දිගාමඩුල්ල යන නම් වලින් හැඳින්වුන බව වංශ කථාවන්ට අනුව සඳහන් වී ඇත.

දීඝගාමිණීගේ පුත් පණ්ඩුකාභය කුමරු විසින් අනුරාධපුරය සිය අනසකට ගෙන අනුරාධපුරයෙහි අගනුවර පිහිටවනු ලැබීය. මෙතැන් සිට දිගාමඩුල්ල අනුරපුර මහ රජුගේ එක් ප්‍රාදේශීය පාලන කොට්ටාශයක් වූ අතර, එය ප්‍රධාන ධාන්‍යාගාරය වේ .පොළොන්නරු රාජධානිය බිඳ වැටී පාලන අධිකාරිය නිරිත දිග ප්‍රදේශයට තල්ලු වීමත් සමඟ අම්පාර ප්‍රදේශය වල් බිහිවන්නට විය.

මහසෙන් රජුගේ මහා වාරි කර්මාන්ත ව්‍යාපාරය නැගෙනහිර බින්තැන්නේ සිට තමන්කඩුව හා සේරු නුවර ඔස්සේ නුවර කලාපය තෙක් පැතිරී ඇත. ස්වකීය සංවර්ධන කටයුතුවලදී රුහුණ අමතක නොකළහ. දීර්ඝ කාලයක් තිස්සේ වර්ධනය වූ වාරි කර්මාන්තයට නෂ්ඨාවශිෂ්ට අම්පාර ප්‍රදේශය තුළ සිසාරා ඇවිද යන විට දැකිය හැක.

ලංකාවේ ඉතිහාසය ශිලා ලේඛන ගත කිරීමට පෙර ගල්ඔය මිටියාවත වැදි ජනතාවගේ ගොදුරු බිමක්ව පැවති බව ආචාර්ය ආර්.එල්. බ්‍රෝහියර් මහතා සඳහන් කර ඇත. මුල් ආර්යයන් විසින් පිහිටවුනු ක්‍රි.පූ.03 වන සියවස දක්වා දිවෙන සෙල්ලිපි වල දක්නට ඇත.

අම්පාර දිසාවේ ඉතිහාසය පිළිබඳව කතා කරන කළ රජගල ප්‍රදේශය වටිනා ඓතිහාසික තොරතුරු රැසක් ලැබි ඇති ප්‍රදේශයකි. මෙහි දක්නට ලැබෙන චෛත්‍යයක නටඹුන් අසල පිහිටා ඇති සෙල් ලිපියක "යෙ ඉමදිය පටමය අගනන ඉඨික තෙර මහිද තෙර තුබෙ "යන වාක්‍ය කොටා ඇත.මේ අනුව එම චෛත්‍යය මෙම ද්වීපයේ අභිවෘද්ධිය සඳහා පැමිණි ඉට්ඨීය හා මහින්ද තෙරුන්ගේ දාගැබ ලෙස හඳුන්වා දී ඇත.මෙය මිහිඳු හිමියන්ගේ ලංකා ගමන හා ඒ සමඟ පැමිණි ඉට්ඨීය හිමියන් පිළිබඳ මහා වංශ පුවත සනාථ කරන්නකි. මිහිඳු හිමි පිරිණිවන් පෑ පසු ධාතුන් නිදන් කර රටපුරා දාගැබ් ගොඩ නංවා ඇති බවට වන පුවතද සනාථ කරන්නකි. මේ අතරම රජගලින් ලැබී ඇති තවත් ලිපියක දුටුගැමුණු රජුගේ බිසවක් සේ හඳුන්වා ඇති රජිතා නම් කාන්තාව ගැන සඳහන් වේ. මෙය ඓතිහාසික වශයෙන් අතිශය වැදගත් ලිපියකි. එසේම නන්දිමිත්‍ර යෝධයාගේ හා දුටුගැමුණු රජුගේ පවුල් දෙක අතර විවාහ සබඳතාවක් පිළිබඳ සාධකයක් සපයන සෙල් ලිපියක්ද රජගලින් සොයාගෙන ඇත. මේ සෙල් ලිපිය හා අම්පාර දිස්ත්‍රික්කයේ

බමුණුගල සෙල් ලිපියත් එකට සලකා බැලීමේදී දුටුගැමුණු රජුගේ දියණිය නන්දිමිත්‍රාගේ පුතෙක් සමඟ විවාහ වී සිටි බවට සාක්ෂි සැපයේ.

දසවැනි සියවසට අයත් කොණ්ඩුවටුවාන් සෙල්ලිපිය සුවිශේෂී වැදගත් කමක් ඇති ඓතිහාසික මූලාශ්‍රයක් ලෙස විද්වත්තු පිළිගනිති. එම සෙල්ලිපියට අනුව අනුරාධපුර යුගයේ අවසාන භාගය වන විටත් අම්පාර සශ්‍රීක සිංහල ජනාවාසයක් වූ බව පැහැදිලිව ඔප්පු කරයි. එකී ගම් ස්වයංපෝෂිත ගම්මාන බව " අලෙවිය සඳහා පිටතින් බඩු නොගෙන්විය යුතු බවට" කර ඇති නියෝගයන් ඇත. එසේම මෙම ප්‍රදේශය අනුරාධපුර රාජධානියට අයත්ව පාලනය වූ බවට තොරතුරු මෙකී සෙල් ලිපියෙන් ප්‍රකාශ වේ.

පොළොන්නරු යුගයේදී අම්පාර වැදගත් තැනක් හිමිකරගත් බවට සාක්ෂි ඉතිහාසයෙන් ලැබේ. සොළී ආධිපත්‍යයෙන් රට මුදාගෙන රට එක්සත් කිරීම සඳහා ගෙන ගිය මහා විජයබාහු (1055-1110) රජුගේ විමුක්ති ව්‍යාපාරයට ද දිගාමඩුල්ල උපකාරී වූ බවට තොරතුරු ඇත. එතුමා දිගාමඩුල්ලේදී කළ සටන් කිහිපයක් ගැන සඳහන් වේ. සුගලා රැජිනගේ ආධිපත්‍යයට දිගාමඩුල්ල අවනතව තිබූ බවට තොරතුරු ලැබිණි. මහා පරාක්‍රමබාහු (1153- 1186) රජතුමා දන්ත දාතූන් වහන්සේ ලබාගැනීම සඳහා සුගලා රැජිණ සමඟ යුද්ධ කරන ලද්දේ දීඝවාපියේදී බව ලංකා විශ්ව විද්‍යාලයේ ලංකා ඉතිහාසයේ ග්‍රන්ථයේ සඳහන් වෙයි. මෙයින් පැහැදිලි වන වැදගත් කරුණ වන්නේ ලංකා ඉතිහාසයේ එක් අවධියක දළදා වහන්සේගේ අයිතිය දීඝවාපියට හිමිව තිබූ බවය. කීර්ති ශ්‍රී රාජසිංහ රජු 1756 වර්ෂයේදී දීඝවාපියට පැමිණ දීඝවාපී දාගැබ ප්‍රතිසංස්කරණය කරවා එම විහාරස්ථානය බන්ඩිගොඩේ නීග්‍රෝධ නායක හිමියන්ට පූජාකළ බවට දීඝවාපී සන්නසේ සඳහන් වේ. මේ පුවත වංශ කථා පුවත් වලින් ද සනාථ වන අතර, දීඝවාපි චෛත්‍යයේ බටහිර වාහල්කඩේ මෑතක් වනතුරු දැකගන්නට තිබූ දුර්වර්ණ වී ගිය චිත්‍ර සටහන් නුවර යුගයට අයත් චිත්‍ර සම්ප්‍රදායට අයත් බව පෙනී ගොස් තිබුණි.

1818 න් පසුව අම්පාර ප්‍රදේශයේ සිදු වූ වැදගත් සිදුවීමක් ලෙස පෙන්වා දිය හැක්කේ වාරි කර්මාන්ත සංවර්ධනයේලා බ්‍රිතාන්‍යයන් දැක්වූ දායකත්වයයි. විශේෂයෙන්ම 1853 දී සර් හෙන්රි වෝඩ් ආණ්ඩුකාරවරයා නැගෙනහිර පළාතේ අම්පාර ප්‍රදේශයට පැමිණ මේ ප්‍රදේශයේ වාරි කර්මාන්ත සංවර්ධනය සඳහා මුදල් යෙදවීමේ වැදගත්කම පිළිබඳ අවබෝධ කර ගැනිම වාරි කර්මාන්ත පුනරුත්ථාපනය සඳහා එවක බ්‍රිතාන්‍ය රජයේ මුදල් යෙදවිම ආයෝජනය කිරීමක් සඳහා හේතු විය. මේ යටතේ අම්පාර දිස්ත්‍රික්කයට අයත් දිවුලාන, දඩයන්තලාව, සාගම වැනි ජලාශ පුනරුත්ථාපනය කිරීමත්, 1880 දශකයේදි පට්ටිපොල ආරු ව්‍යාපාරයේ ආරම්භ කිරීමත් සුවිශේෂී සිදුවීමක් විය. පට්ටිපොළ ආරු යෝජනා ක්‍රමය යටතේ අම්පාර වැව, කොන්ඩුවටුවාන වැව, එරගම වැව ආදී ජලාශද ගල්ඔය දිගට, අමුණු රැසක්ද ඉදිකර අක්කර 40000 කට ආසන්න ප්‍රමාණයකට වගාවන් සඳහා ජලය ලබාදීමත් සමඟ දිවයිනේ විශාලතම කුඹුරු යාය අම්පාර ප්‍රදේශයෙන් ඉදි කෙරුණි.

ඉන්පසුව 1930 දශකය වන විට ගල්ඔය වාරිමාර්ග යෝජනා ක්‍රමය පිළිබඳ මූලික අදහස වාරිමාර්ග අධ්‍යක්ෂ කෙනඩි විසින් ඉදිරිපත් කිරීමත් සමඟ නැගෙනහිර පළාතේ අම්පාර ප්‍රදේශය නැවත වරක් සංවර්ධනයේ කේන්ද්‍රස්ථානයක් බවට පත්විය. විශේෂයෙන්ම ශ්‍රී ලාංකීය වාරි කර්මාන්ත ඉතිහාසයේ නව පරිච්ඡේදයක් අරඹමින් උස්බිම් ආශ්‍රිත ගැඹුරු ජලාශ ඉදිකර වාරිමාර්ග සඳහා ජලය සැපයීමේ ක්‍රමවේදය යෝජනා කරනු ලැබුවේ ගල්ඔය වාරිමාර්ග සංවර්ධන සැලැස්ම මඟිනි.

ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය පාලනයට නව අත්තිවාරමක් පිහිටුවීමට ආධාර වූ කෝල්බෲක් කැමරන් යෝජනා අනුව 1833 දී දිවයින පළාත් පහකට බෙදන ලදී. එහිදී අම්පාර ප්‍රදේශය නැගෙනහිර පළාතට අයත් විය. නැගෙනහිර පළාත ත්‍රිකුණාමලය සහ මඩකලපුව දිස්ත්‍රික්කවලින්ද තමන්කඩුව සහ බින්තැන්න ප්‍රදේශවලින්ද සමන්විත විය. මෙසේ පිහිට වූ පළාත් නැවත දිස්ත්‍රික්ක වලට බෙදුණි. ඒ අනුව නැගෙනහිර පළාත ත්‍රිකුණාමලය සහ මඩකලපුව යන දිස්ත්‍රික්ක වලින් යුක්ත විය. මඩකලපුව දිස්ත්‍රික්කයට දිගාමඩුල්ල සහ බින්තැන්න ඇතුළත් වේ. 1837 දී බින්තැන්න බදුල්ල දිස්ත්‍රික්කයට යා කරන ලදී. මෙතැන් සිට 1961 දී අම්පාර දිස්ත්‍රික්කය පිහිටුවන තුරු දිගාමඩුල්ල ප්‍රදේශය පාලන බෙදීම් වලට පාත්‍ර නොවුණි.

## 1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

**<u>අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයීය දැක්ම, මෙහෙවර</u>**
**<u>ප්‍රකාශය හා අගයන්</u>**

**දැක්ම**

**විකසිත ප්‍රජාවකින් හෙබි ඉසුරුපිරි දිස්ත්‍රික්කයක්.**

**මෙහෙවර**

දිස්ත්‍රික්කයේ සම්පත් ප්‍රශස්ත ලෙස යහපාලනමය යාන්ත්‍රණය ඔස්සේ කළමනාකරණය කර තිරසර සංවර්ධනය කරා මෙහෙයවමින් නිදහස් හා සුරක්ෂිත හෘදයාංගම පරිසරයක දැනුමෙන්, නිපුණත්වයෙන්, නිර්මාණශීලීත්වයෙන් හා නිරෝගී බවින් සපිරුණු ඉහළ ජීවන තත්ත්වයෙන් හෙබි, ජනතාවක් සහිත ඉසුරුපිරි දිස්ත්‍රික්කයක් ගොඩනැගීම.

**අපේ අගයන්**

- හෘදය සංවේදී රාජ්‍ය සේවක කැළක්.
- සොයා එන හැම දන මන විකසිත වන විශ්වසනීය සේවයක්.
- නව්‍යත්වය සොයමින් සැනෙකින් විසඳුම් සොයා යන කාර්යය සංස්කෘතියක්.
- පිවිතුරු හා හරිත පරිසරයක් තුළින් අවියෝජනීයව අවශ්‍යතාවයන් ඉටු කර ගන්නා වූ ප්‍රසන්න පරිශ්‍රයක්.
- යහපානලමය යොමුවක්

## 1.3 ප්‍රධාන කාර්යයන්

**<u>දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ආයතන අංශයේ කාර්ය භාරය.</u>**

- කාර්යාලයේ පරිපාලනමය කටයුතු
- ආයතන කාර්යය ( ආයතන, නිවාඩු, දුම්රිය බලපත්‍ර ආදිය)
- ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල පරිපාලන කටයුතු හා අධීක්ෂණ කටයුතු
- ග්‍රාම නිලධාරින්ගේ පරිපාලන කටයුතු
- වී මිල දී ගැනීම් කටයුතු

**<u>දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ගිණුම් අංශයේ කාර්යය භාරය</u>**

- දිස්ත්‍රික්කයේ සියලුම ප්‍රාදේශිය ලේකම් කාර්යාල හා දිස්ත්‍රික් ලේකම් කාර්යාල අතර ප්‍රතිපාදන හා අක්මුදල් බෙදා හැරීම.
- දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල සම්බන්ධ ගිණුම් වාර්තා සකස් කිරීම හා ගණන්දීමේ නිලධාරී වෙත වාර්තා කිරීම.
- දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සියලුම ගෙවීම් කටයුතු

**<u>දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පරිපාලනමය හා සම්බන්ධීකරණ අංශවල කාර්යය භාරය</u>**

- කාර්යාලයේ පරිපාලනමය කටයුතු
- සමාජසේවා කටයුතු
- සංස්කෘතික හා ආගමික කටයුතු
- මානව සම්පත් සංවර්ධන හා කුසලතා වර්ධන පුහුණු කටයුතු
- උප්පැන්න, මරණ, විවාහ රෙජිස්ටාර්වරුන් හා හදිසි මරණ පරික්ෂකවරුන් පත් කිරීම පිළිබඳ කටයුතු
- ජූරි සභික නාමලේඛන සකස් කර අධිකරණයට ඉදිරිපත් කිරීම.
- දිස්ත්‍රික් මට්ටමේ ජාතික උත්සව හා විවිධ වැඩසටහන් සංවිධානය කිරීම.
- මහජන පැමිණිලි සම්බන්ධ කටයුතු
- රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධානයන් හරහා සහයෝගය ලබාදීම.
- ආපදා කළමනාකරණ හා සුනාමි නැවත ගොඩනැංවීමේ කටයුතු
- ගිනි අවි හා පුපුරණ ද්‍රව්‍ය බලපත්‍ර කටයුතු
- සංචාරක නිවාස පිළිබඳ පරිපාලන කටයුතු

## 1.4 සංවිධාන සටහන - දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, අම්පාර



## 1.5 දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා අනුබද්ධිත ආයතන

අම්පාර නගර මධ්‍යයේ සිට කිලෝමීටර් 01ක් පමණ උතුරට බරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය පිහිටා ඇත. දිස්ත්‍රික්කයේ පරිපාලනට අදාළ විශාල කාර්යය භාරයක් මෙම කාර්යාලය මඟින් ඉටු කරනු ලැබේ. දිස්ත්‍රික් කාර්යාලය පිහිටි ගොඩනැගිල්ල ඉතා සවිමත් බවින් යුතු කළුගල් බැම්මෙන් ඉදිකරන ලද හා පැරණි ගොඩනැගිල්ලක් වන අතර එහි පෞඩත්වය ගල්ඔය ව්‍යාපාරය හා බැදී පවතී. බොහෝ දෙනෙකු මෙය හදුන්වන්නේ අම්පාර කච්චේරිය යන නමිනි. මෙම කච්චේරි පරිශ්‍රය තුළ විවිධ දෙපාර්තමේන්තු කාර්යාල හා විවිධ අංශවලින් සමන්විතය. දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ පාලනය වන ප්‍රාදේශීය ලේකම් කාර්යාල 19ක් හා එක් උප ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක් ඇත. එම ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලට ග්‍රාම සේවා වසම් 503 ක් අයත් වේ. ඒවා පහතින් දක්වා ඇත

| අනු අංකය | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | ග්‍රාම සේවා වසම් සංඛ්‍යාව | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සිට ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට ඇති දුර (කි.මී) |
|---|---|---|---|
| 1 | දෙහිඅත්තකණ්ඩිය | 13 | 121 |
| 2 | පදියතලාව | 20 | 82 |
| 3 | මහඔය | 17 | 62 |
| 4 | උහන | 55 | 11 |
| 5 | අම්පාර | 22 | - |
| 6 | දමන | 33 | 17 |
| 7 | ලාහුගල | 12 | 80 |
| 8 | පොතුවිල් | 27 | 75 |
| 9 | තිරුක්කෝවිල් | 22 | 42 |
| 10 | ආලයඩිවෙම්බු | 22 | 28 |
| 11 | අක්කරපත්තුව | 28 | 28 |
| 12 | අඩ්ඩාලච්චේන | 32 | 29 |
| 13 | ඉරක්කාමම් | 12 | 10 |
| 14 | නින්දවූර් | 25 | 26 |
| 15 | කාර්තිව් | 17 | 24 |
| 16 | සායින්දමරුදු | 17 | 25 |
| 17 | කල්මුණ | 29 | 28 |
| 18 | කල්මුණ උතුර (උපකාර්යාලය) | 29 | 28 |
| 19 | නාවිදන්වේලි | 20 | 24 |
| 20 | සම්මන්තුර | 51 | 20 |

## 1.6 අමාත්‍යාංශ/දෙපාර්තමේන්තුව/පළාත් සභාව යටතේ පවතින ආයතන

| අනු අංකය | දෙපාර්තමේන්තු කාර්යාල හා විවිධ අංශ |
|---|---|
| 1. | දිස්ත්‍රික් සමෘද්ධි කාර්යාලය |
| 2. | සහකාර මැතිවරණ කොමසාරිස් කාර්යාලය |
| 3. | දිස්ත්‍රික් මෝටර් රථ ප්‍රවාහන කාර්යාලය |
| 4. | සමාජ ආරක්ෂක මණ්ඩලයේ අම්පාර දිස්ත්‍රික් කාර්යාලය |
| 5. | මිනුම් ඒකක සහ ප්‍රමිති සේවා දෙපාර්තමේන්තුවේ අම්පාර දිස්ත්‍රික් කාර්යාලය |
| 6. | දිස්ත්‍රික් සංඛ්‍යා ලේඛන කාර්යාලය. |
| 7. | ආපදා කළමනාකරණ අංශය |
| 8. | දිස්ත්‍රික් ක්‍රීඩා අංශය |
| 9. | නියෝජ්‍ය ඉඩම් කොමසාරිස් කාර්යාලය |
| 10. | සහකාර ඉඩම් කොමසාරිස් කාර්යාලය (පළාත්) |
| 11. | දිස්ත්‍රික් ඉඩම් ප්‍රතිසංස්කරණ බල මණ්ඩලය |
| 12. | ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුවේ අම්පාර දිස්ත්‍රික් කාර්යාලය |
| 13. | අතිරේක දිස්ත්‍රික් රෙජිස්ටාර් කාර්යාලය. |
| 14. | කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ බීජ සහතික කිරීමේ සේවා කාර්යාලය |
| 15. | පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ අම්පාර දිස්ත්‍රික් කාර්යාලය. |

## 1.7 විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු (තිබේ නම්)

හිස් වාර්තාවකි.

# 02. පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

## <u>2025 වර්ෂයේ ළඟා කරගත් ඉලක්ක</u>

### <u>දිස්ත්‍රික්කය තුළ සංවර්ධන ක්‍රියාකාරකම්</u>

“පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්” ප්‍රතිපත්ති ප්‍රකාශය මගින් රටේ ජනතාවගේ ජීවන මට්ටම ඉහළ නැංවීමේ අරමුණ ඇතිව නිෂ්පාදන ආර්ථිකයක් ගොඩනැගීම තීරණාත්මක සහ ප්‍රමුඛ කාර්යයක් ලෙස හඳුනාගනිමින් 2025 වර්ෂය තුල දී ක්‍රියාත්මක වූ ප්‍රධාන සංවර්ධන වැඩසටහන් ලෙස “විමධ්‍යගත අයවැය (DCB) වැඩසටහන සහ දිස්ත්‍රික් සංවර්ධන වැඩසටහන” සඳහන් කළ හැක. කෘෂිකර්මය, සත්ත්ව හා ධීවර කර්මාන්ත නඟා සිටුවීම, ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනය, ව්‍යවසායකත්ව සංවර්ධනය, දේශීය නිෂ්පාදන කර්මාන්ත ප්‍රවර්ධනය, සංචාරක කර්මාන්තය සඳහා අවශ්‍ය මූලික යටිතල පහසුකම් සංවර්ධනය මෙන්ම නිෂ්පාදන ආර්ථිකයක් උදෙසා අවශ්‍යවන පොදු යටිතල පහසුකම් සංවර්ධනය යනාදි සංවර්ධන අංශ 08 ක් යටතේ විමධ්‍යගත අයවැය වැඩසටහන ක්‍රියාත්මක විය.

මෙම සංවර්ධන වැඩසටහන් යටතේ නිෂ්පාදන ආර්ථිකය ගොඩනැගීම සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සලසා දෙමින් දරිද්‍රතාවයෙන් පෙළෙන ජනතාව නිෂ්පාදන කාර්යයට දායක කරගැනීම සහ එම ජනතාවගේ ආදායම් මට්ටම ඉහළ නැංවීම තුළින් ජීවන තත්ත්වය උසස් කිරීම අපේක්ෂා කරමින් විමධ්‍යගත අයවැය වැඩසටහන හා දිස්ත්‍රික් සංවර්ධන වැඩසටහන දිස්ත්‍රික්කයේ සියලුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල මෙන්ම කල්මුණ උතුර උප ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ද ක්‍රියාත්මක විය.

කෙසේ වෙතත්, වර්ෂයේ දෙවන කාර්තුව තුළ පැවති පළාත් පාලන මැතිවරණය මෙන්ම වර්ෂයේ අවසන් මාස කිහිපය තුළ පැවති අයහපත් කාලගුණික තත්ත්වයන් හේතුවෙන් නියමිත පරිදි ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට සහ අවසන් කිරීමට බලපෑම් ඇති වුවද දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මගපෙන්වීම අනුව අනුමත කරන ලද ව්‍යාපෘති බොහොමයක් නියමිත කාල සීමාව තුළ සාර්ථකව ක්‍රියාත්මක කිරීමට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්ට හැකි විය. තවද, අයහපත් කාලගුණික තත්ත්වය හේතුවෙන් ඇතැම් ව්‍යාපෘතීන් අවසන් කර ගෙවීම් කිරීමට ප්‍රමාණවත් කාලයක් නොලැබීම හේතුවෙන් ඒ සඳහා 2026 වර්ෂයට ප්‍රතිපාදන ඉල්ලීම් කර, මේ වනවිට අදාළ අමාත්‍යාංශ වෙතින් ලබා දී ඇත.

ඒ අනුව, විමධ්‍යගත අයවැය වැඩසටහන යටතේ රු. මිලියන 80.0ක ප්‍රතිපාදන මඟින් ව්‍යාපෘති 54ක් සහ දිස්ත්‍රික් සංවර්ධන වැඩසටහන යටතේ රුමිලියන 59.0ක ප්‍රතිපාදන යොදවා සංවර්ධන ව්‍යාපෘති 45ක් සාර්ථකව නිම කිරීමට හැකිවිය.

තවද, ප්‍රවාහන හා සිවිල් සේවා අමාත්‍යාංශයේ සම්බන්ධීකරණයෙන් දිස්ත්‍රික්කයේ ප්‍රමුඛතා ගත කර හඳුනාගත් මාර්ග සංවර්ධන ව්‍යාපෘති අදියර 02 ක් යටතේ රු. මිලියන 585.65 ක් වැය කරමින් මාර්ග සංවර්ධන ව්‍යාපෘති 231ක් සියලුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල හා කල්මුණ උතුර උප ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සාර්ථකව ක්‍රියාත්මක කිරීමට හැකි වූ අතර මෙහිදි ප්‍රධාන වශයෙන් නිෂ්පාදන ආර්ථිකයක් ඇති කිරීමට අවශ්‍ය මූලික යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ රජයේ අපේක්ෂා ඉහළ නැංවීමකි.

## සංවර්ධන වැඩසටහන් වල ප්‍රගතිය – 2025 ( 2025.12.31 දිනට)

| # | ව්‍යාපෘතියේ නම | 2024 වර්ෂය සඳහා මුළු ප්‍රතිපාදන (රු. මිලියන) | ව්‍යාපෘති සංඛ්‍යාව | මුළු වියදම (රු.මිලියන) |
|---|---|---|---|---|
| 1 | විමධ්‍යගත අයවැය වැඩසටහන 237-01-02-01-2509 | 80.00 | 54 | 78.315 |
| 2 | දිස්ත්‍රික් සංවර්ධන වැඩසටහන 270-01-01-014-2509-00-11 | 59.00 | 45 | 57.853 |
| 3 | ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන -අදියර 01 | 280.84 | 104 | 270.49 |
| 4 | ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන -අදියර 02 | 304.81 | 127 | 279.14 |
| 5 | ආගමික ස්ථාන සංවර්ධන වැඩසටහන | 42.364 | 58 | 40.489 |
| 6 | පාසල් ක්‍රීඩා පිටි සංවර්ධන වැටසටහන | 10.301 | 7 | 10.177 |
| 7 | ඒකාබද්ධ මාර්ග සංවර්ධන වැඩසටහන | 48.024 | 12 | 46.705 |
| 8 | නැවත පදිංචි කිරීමේ නිවාස ව්‍යාපෘතිය (රු.මි.0.9) | 229.0707 | 92 | 228.879 |
| 9 | නැවත පදිංචි කිරීමේ නිවාස ව්‍යාපෘතිය (රු.මි.1.5) | | 97 | |
| 10 | නැවත පදිංචි කිරීමේ ව්‍යාපෘතිය - විදුලිය සබඳතා ලබාදීම | | 358 | |
| 11 | නැවත පදිංචි කිරීමේ ව්‍යාපෘතිය - ජලය සබඳතා ලබාදීම | 98.77125 | 273 | 96.293 |
| 12 | නැවත පදිංචි කිරීමේ ව්‍යාපෘතිය - මාර්ග සංවර්ධනය | | 31 | |
| 13 | නීල ධජ ව්‍යාපෘතිය (Blue Flag project) | 9.951 | 8 | 9.492 |
| 14 | පිරිසිදු ශ්‍රී ලංකාවක් වැඩසටහන ( Clean Sri Lanka programme) | 3.518 | 8 | 1.845 |
| 15 | ආපදා කලමණාකරන ව්‍යාපෘතිය | 9.14 | 3 | 8.677 |
| 16 | සනිපාරක්ෂක පහසුකම් වැඩිදියුණුකිරීමේ වැටසටහන (SACOSAN) | 7.65 | 17 | 7.403 |
| **එකතුව** | | **1,183.44** | **1,294.00** | **1,135.76** |

**<u>අම්පාර දිස්ත්‍රික්කයට මෑතකාලීනව බලපෑ දිට්වා (Ditwa) සුළි කුණාටුව නිසා ඇති වූ ගංවතුරෙන් විපතට පත් පවුල් සඳහා ආධාර ලබාදීම - 2025</u>**

මෑත කාලීනව අම්පාර දිස්ත්‍රික්කයට බලපෑ ගංවතුර තත්ත්වය හේතුවෙන් පීඩාවට පත් පවුල් 7,520ක් හඳුනාගත් අතර, එහිදී වැඩිම ආපදා තත්ත්වයක් වාර්තා වූ දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ආපදාවට ලක්වූ පවුල් සංඛ්‍යාව 731 ක් වූ අතර ඔවුන් ආපදා මධ්‍යස්ථාන 05 ක රැඳී සිටින ලදී.

රජය මඟින් ජාතික මට්ටමේ විශේෂ ආධාර සැපයීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කරන ලද අම්පාර දිස්ත්‍රික්කය තුළ විවිධ ක්ෂේත්‍ර යටතේ අපාදාවට ලක් වුවන් සඳහා දීමනා ලබාදීම පහත පරිදි ක්‍රියාත්මක කරන ලදී.

| අනු අංකය | වන්දි ලබාදීමේ ක්ෂේත්‍ර | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | ගෙවන ලද මුදල (රු.මිලියන) |
|---|---|---|---|
| 1 | නිවාස පිරිසිදු කිරීමේ දීමනාව | 1,831 | 45.78 |
| 2 | ගෘහස්ත උපකරණ ලබාදීම | 383 | 19.15 |
| 3 | නිවාස කුළී දීමනාව | 93 | 2.33 |
| 4 | පාසල් ළමුන් සඳහා දීමනාව | 407 | 6.11 |
| 5 | වී ගොවිතැන් හානි සඳහා ආධාර | 3,308 | 295.56 |
| **මුළු එකතුව** | | **6,022** | **368.93** |

තවද, ආපදාවට ලක් වු ප්‍රදේශයන් හි මහාමාර්ග, පාලම් හා බොක්කු 149කට ආසන්න ප්‍රමාණයක් හා වාරිමාර්ග පද්ධති හානි වීමට අදාළ සංවර්ධන ව්‍යාපෘති 402ක් මේ වනවිට හඳුනාගෙන ඇති අතරම ජල ප්‍රවාහන හා විදුලි සම්බන්ධතා නැවත යාවත්කාලීන කිරීමට දැරීමට සිදුවෙතැයි අපේක්ෂිත වියදම රු. මිලියන 477.63 කි. එමෙන්ම, කෘෂිකාර්මික, ධීවර කර්මාන්තය හා පශු සම්පත් හානිවීම් සැලකිය යුතු ප්‍රමාණයක් මෙම ආපදා තත්ත්වය නිසා වාර්තා වු අතර මෙම තත්ත්වයන් නැවත නඟා සිටුවීම සඳහා රජය මඟින් 2026 වසරේදී වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට පියවර ගනිමින් පවතී.

**<u>2025 වර්ෂයේදී මුහුණ දුන් අභියෝග</u>**

2025 වර්ෂයේ ඉලක්ක සපුරා ගැනීමේදී පහත සඳහන් අභියෝගයන්ට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මුහුණ දුන් අතර, එම අභියෝග සාර්ථකව කළමනාකරණය කර ගැනීමට හැකි විය.

1. වසර ආරම්භක කාර්තුවේ පළාත් පාලන ආයතන මැතිවරණය පැවැත්වීම හේතුවෙන් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී ප්‍රමාදයන් සිදු වු අතර දිට්වා සුළි කුණාටුව සමඟ ඇති වු ගංවතුර තත්ත්ව වැනි අහිතකර කාළගුණික තත්ත්වයන්ද සිදුවිය.

2. ගංවතුර තත්ත්වය තුළ, දිස්ත්‍රික්කයේ ජනතාවගේ ආදායම් මට්ටම අඩුවීම සහ තම දෛනික අවශ්‍යතා සපුරාලීම සඳහා පෝෂ්‍යදායී ආහාර සොයා ගැනීමේ දුෂ්කරතා වැනි දුෂ්කරතා රැසකට මුහුණ දුන්හ. එබැවින් එම අසරණ ජනතාවට අවශ්‍ය ආධාර ලබාදීම සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාල මෙන්ම විදේශීය හා දේශීය ආයතන සමඟ ද සමීපව සම්බන්ධීකරණය කිරීමට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට සිදුවිය.

**2026 වර්ෂය සඳහා සැලසුම්**

දිස්ත්‍රික්කයේ ජනතාවගේ ආහාර සුරක්ෂිතතාවය හා පෝෂණය තහවුරු කිරීම, ජීවන තත්ත්වය ඉහළ නැංවීම, ගංවතුර වැනි ස්වභාවික ආපදා තත්ත්ව වලදී පත්වන අපහසුතා පිටු දැකීමට අවශ්‍ය සහය ලබා දීම සහ අඩු ආදායම්ලාභී ජනතාවට සහනදායී ආදායම් මට්ටමක් ළඟා කර ගැනීමට සහය දීම අරමුණු කර ගනිමින් පහත සඳහන් සැලසුම් 2026 වර්ෂයේදී ක්‍රියාවට නැංවීමට අපේක්ෂිතය. ඒ අනුව, 2026 වර්ෂය සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සමස්ථ අරමුණ වනුයේ රටේ ආර්ථික සංවර්ධනයට දායක වන අතරම ප්‍රදේශයේ ජනතාවගේ යහපැවැත්ම තහවුරු කිරීමයි.

1. විමධ්‍යගත අයවැය වැඩසටහන යටතේ ආසන්න වශයෙන් රු. මිලියන 100 ක ප්‍රතිපාදන යොදවා නිෂ්පාදන ආර්ථිකය ඉලක්ක කරගත් ව්‍යාපෘති සියළු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස ආවරණය වන පරිදි ක්‍රියාත්මක කිරීම.
2. ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන යටතේ රු. මිලියන 250ක ප්‍රතිපාදන යොදවා දිස්ත්‍රික්කයේ සියලුම ප්‍රාදේශීය ලේකම් කාර්යාල ආවරණය වන පරිදි ග්‍රාමීය මාර්ග සංවර්ධනය කිරීම.
3. ප්‍රජාශක්ති ජාතික ව්‍යාපාරය යටතේ රු. මිලියන 776.7 ක ප්‍රතිපාදන මගින් ප්‍රජා සංවර්ධන සහා හරහා හඳුනාගත් විවිධ ක්ෂේත්‍රයන්හි ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.
4. ග්‍රාමීය ජීවනෝපාය සංවර්ධනය ඉලක්ක කර කෘෂිකර්ම අමාත්‍යංශයේ ප්‍රතිපාදන මත වාණිජමය සත්ත්ව පාලන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.
5. Clean Sri Lanka වැඩසටහන යටතේ විවිධ පාරිසරික, සමාජීය හා ආචාර ධර්ම සංවර්ධන වැඩසටහන් රාශියක් ක්‍රියාත්මක කිරීම.
6. පෝෂණීය ආහාර සපයා ගැනීමේ අපහසුතාවයෙන් පෙලෙන ජනතාවගේ දෛනික පෝෂණ අවශ්‍යතා සැපයීම සඳහා ආහාර සුරක්ෂිතතා හා පෝෂණ වැඩසටහන් 2026 වර්ෂයේදී තවදුරටත් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිතය.
7. සංචාරක කර්මාන්තය ඉලක්ක කර විවිධ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම. (පොතුවිල් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ රුපියල් මිලියන 70ක ප්‍රතිපාදන මගින් ක්‍රියාත්මක වන Sunset view park ව්‍යාපෘතිය)
8. යුද්ධයෙන් අවතැන් වූවන් සඳහා නැවත පදිංචි කිරීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.
9. කෘෂි අංශයේ දිස්ත්‍රික් දායකත්වය ඉහළ නැංවීම සඳහා නවීන කෘෂි තාක්ෂණය භාවිතයෙන් කෘෂි නව්‍යකරණ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.
10. රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධානවල සහයෝගීතාවයෙන් ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන් මඟින් අඩු ආදායම්ලාභී පවුල්, කාන්තාවන් හා තරුණ ප්‍රජාව සවිබල ගැන්වීමට අපේක්ෂිතය.
11. ගොවීන්ගේ අස්වැන්න ආරක්ෂා කිරීමේ අරමුණ හා මිනිස් ජීවිත මෙන්ම වන අලින්ගේ ජීවිත ද ආරක්ෂා කිරීමේ අරමුණෙන් පවත්නා විදුලි වැටවල් තවදුරටත් පුළුල් කිරීමට අපේක්ෂිතය.
12. දිස්ත්‍රික්කයේ සෞඛ්‍ය අංශයේ ගුණාත්මකභාවය ඉහළ නැංවීමට හා අධ්‍යාපන පහසුකම් ඉහළ නැංවීම සඳහා විවිධ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.
13. මුන්දෙණිආරු ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා වාරිමාර්ග දෙපාර්තමේන්තුව වෙත අවශ්‍ය සියළු සහයෝගයන් ලබාදීම.
14. ගල්ඔය ගංගාවේ ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කිරීමට වාරිමාර්ග දෙපාර්තමේන්තුව වෙත අවශ්‍ය සියළු සහයෝගයන් ලබාදීම.
15. අස්වැසුම සමාජ සුබසාධන වැඩසටහන් දිස්ත්‍රික්කය තුළ නියමිත පරිදි ක්‍රියාත්මක කිරීම.

චින්තක අබේවික්‍රම,
දිසාපති / දිස්ත්‍රික් ලේකම්,
අම්පාර දිස්ත්‍රික්කය.
Email - distsecampara@gmail.com
Fax - 063-2222130

## 03 පරිච්ඡේදය - 2025දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ථ මූල්‍ය කාර්ය සාධනය

### 3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

| සංශෝධිත අයවැය ප්‍රතිපාදන 2025 | | සටහන | සත්‍ය 2025 | සත්‍ය 2024 | |
|---|---|---|---|---|---|
| රු. | | | රු. | රු. | |
| - | ආදායම් ලැබීම් | | - | - | |
| - | ආදායම් බදු | 1 | - | - | ඒසීඒ-1 |
| - | දේශීය භාණ්ඩ හා සේවා මත බදු | 2 | - | - | |
| - | ජාත්‍යන්තර වෙළඳාම මත බදු | 3 | - | - | |
| - | බදු නොවන ආදායම් හා වෙනත් | 4 | - | - | |
| - | මුළු ආදායම් ලැබීම් (අ) | | - | - | |
| - | ආදායම් නොවන ලැබීම් | | - | - | |
| - | භාණ්ඩාගාර අග්‍රිම | | 6,778,708,564 | 6,327,349,004 | ඒසීඒ-3 |
| - | තැන්පතු | | 659,249,159 | 642,099,517 | ඒසීඒ-4 |
| - | අත්තිකාරම් ගිණුම් | | 103,799,670 | 100,377,774 | ඒසීඒ-5 |
| | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම් | | - | - | |
| - | මුළු ආදායම් නොවන ලැබීම් (ආ) | | 7,541,757,393 | 7,069,826,295 | |
| - | මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ) | | 7,541,757,393 | 7,069,826,295 | |
| | භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඈ) | | 70,692,497 | 14,481,291 | |
| | ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඈ) | | 7,471,064,896 | 7,055,345,004 | |
| | අඩු කළා : වියදම් | | | | |
| - | පුනරාවර්තන වියදම් | | - | - | |
| 2,347,680,000.00 | වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ | 5 | 2,326,469,064 | 1,918,341,612 | |
| 277,800,000.00 | අනෙකුත් භාණ්ඩ හා සේවා | 6 | 229,522,925 | 235,102,891 | ඒසීඒ-2(ii) |
| 5,200,000.00 | සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම් | 7 | 2,869,444 | 540,732,863 | |
| - | පොළී ගෙවීම් | 8 | - | - | |
| - | වෙනත් පුනරාවර්තන වියදම් | 9 | - | 440,400 | |
| 2,630,680,000.00 | මුළු පුනරාවර්තන වියදම් (ඊ) | | 2,558,861,433 | 2,694,617,767 | |
| | ප්‍රාග්ධන වියදම් | | | | |
| 143,400,000.00 | ප්‍රාග්ධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම | 10 | 129,983,984 | 44,923,894 | |
| 123,000,000.00 | ප්‍රාග්ධන වත්කම් අත්පත් කර ගැනීම | 11 | 90,927,688 | 78,816,549 | |
| - | ප්‍රාග්ධන මාරුකිරීම් | 12 | - | - | ඒසීඒ-2(ii) |
| - | මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම | 13 | - | - | |
| 3,600,000.00 | හැකියා වර්ධනය | 14 | 2,846,255 | 3,182,554 | |
| 59,000,000.00 | වෙනත් ප්‍රාග්ධන වියදම් | 15 | 57,853,917 | - | |
| 329,000,000.00 | මුළු ප්‍රාග්ධන වියදම් (උ) | | 281,611,844 | 126,922,997 | |
| | තැන්පතු ගෙවීම් | | 595,434,478 | 514,136,116 | ඒසීඒ-4 |
| | අත්තිකාරම් ගෙවීම් | | 165,632,609 | 178,457,699 | ඒසීඒ-5 |
| | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම් | | - | - | |
| | ප්‍රධාන ලෙජර් වියදම් (ඌ) | | 761,067,087 | 692,593,815 | |
| | මුළු වියදම් එ = (ඊ+උ+ඌ) | | 3,601,540,364 | 3,514,134,579 | |
| - | දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ) | | 3,869,524,532 | 3,541,210,426 | |
| | අග්‍රිම සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂය | | 3,869,524,532 | 3,541,210,426 | ඒසීඒ-7 |
| | දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය | | | | ඒසීඒ-3 |
| | | | - | (0) | |

ඒ.එල්. මහරූෆ්
ප්‍රධාන ගණකාධිකාරී
අම්පාර දිසාපති වෙනුවට

## 3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-8

### 2025 දෙසැම්බර් 31 දිනට
### මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

| | සටහන | සත්‍ය 2025 රු. | 2024 රු. |
|---|---|---|---|
| <u>මූල්‍ය නොවන වත්කම්</u> | | | |
| දේපළ, පිරියත හා උපකරණ | ඒසීඒ-6 | 4,186,539,150 | 10,826,185,165 |
| <u>මූල්‍ය වත්කම්</u> | | | |
| අත්තිකාරම් ගිණුම් | ඒසීඒ-5/5(ඒ) | 343,288,740 | 281,216,669.00 |
| මුදල් හා මුදල් සමාන දෑ | ඒසීඒ-3 | - | - |
| **මුළු වත්කම්** | | **4,529,827,890** | **11,107,401,834** |
| <u>ශුද්ධ වත්කම් / ස්කන්ධය</u> | | | |
| භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම් | | 79,916,787 | 81,659,396 |
| දේපළ පිරියත හා උපකරණ සංචිතය | | 4,186,539,150 | 10,826,185,165 |
| කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය | ඒසීඒ-5(බී) | | |
| <u>ජංගම වගකීම්</u> | | | |
| තැන්පතු ගිණුම් | ඒසීඒ-4 | 263,371,953 | 199,557,273 |
| අග්‍රිම ශේෂය | ඒසීඒ-3 | - | - |
| **මුළු වගකීම්** | | **4,529,827,890** | **11,107,401,834** |

පිටු අංක 1 සිට 35 දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක 36 සිට 79 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහි අන්තර්ගත කොටස් වේ. **මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025.12.17 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 විධිවිධානයන්ට අනුකූලව** සිදුකර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

2018 අංක 19 දරන විගණන පනතේ 38 (1) (ඇ) වගන්තිය අනුව මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

ප්‍රධාන ගණන්දීමේ නිලධාරී
එස්.ආලෝකබණ්ඩාර
ලේකම්
රාජ්‍ය පරිපාලන,පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
දිනය : 2026/02/06

ගණන්දීමේ නිලධාරී
චින්තක අබේවික්‍රම
දිස්ත්‍රික් ලේකම්-අම්පාර
දිනය : 2026/02/06

ප්‍රධාන ගණකාධිකාරී
ඒ.එල්.මහරූෆ්
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය -අම්පාර
දිනය : 2026. 02 . 06

එස්. ආලෝකබණ්ඩාර
ලේකම්
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය

චින්තක අබේවික්‍රම
දිස්ත්‍රික් ලේකම්/දිසාපති
අම්පාර දිස්ත්‍රික්කය

ඒ.එල්. මහරූෆ්
ප්‍රධාන ගණකාධිකාරී
අම්පාර දිසාපති වෙනුවට

## **3.3** මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-3

**2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**
**මුදල් ප්‍රවාහ ප්‍රකාශනය**

| | සත්‍ය 2025 රු. | සංශෝධිත 2024 රු. |
|---|---|---|
| <u>මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u> | | |
| මුළු බදු ලැබීම් | - | - |
| ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර | - | - |
| ලාභ | - | - |
| ආදායම් නොවන ලැබීම් | - | - |
| වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම් | 246,725,890 | 220,642,384 |
| අග්‍රිම ලැබීම් | 6,778,708,564 | 6,327,495,277 |
| අත්තිකාරම් අයකර ගැනීම් | 104,778,564 | 105,380,803 |
| තැන්පතු ලැබීම් | 659,249,159 | 642,099,517 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)** | **7,789,462,177** | 7,295,617,981 |
| <u>අඩුකළා : මුදල් වැය කිරීම්</u> | | |
| පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් | 2,550,067,189 | 2,143,127,579 |
| සහනාධාර සහ මාරුකිරීම් | 2,869,444 | 540,732,863 |
| මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම , මූලධන වංදකිරීම්, ධාරිතා වර්ධනය හා වෙනත් මූලධන වියදම් | 190,684,156 | |
| වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම් | 4,119,491,676 | 3,832,069,078 |
| භාණ්ඩාගාරයට පියවන ලද අයිතම | 70,692,497 | 14,481,291 |
| අත්තිකාරම් ගෙවීම් | 169,295,049 | 124,148,057 |
| තැන්පතු ගෙවීම් | 595,434,478 | 514,136,116 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)** | **7,698,534,490** | 7,168,694,984 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)** | **90,927,688** | 126,922,997 |
| <u>ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u> | | |
| පොලී | - | - |
| ලාභාංශ | - | - |
| මිලකළ ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම | - | - |
| උපණය අයකර ගැනීම් | - | - |
| ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ) | - | - |
| <u>අඩුකළා : මුදල් වැය කිරීම්</u> | | |
| මූලධන වත්කම් ඉදිකිරීම, මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්පත් කර ගැනීම | 90,927,688 | 126,922,997 |
| ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ) | 90,927,688 | 126,922,997 |
| ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඈ)-(ඉ) | **(90,927,688)** | (126,922,997) |
| මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ) = (ඇ) + (ඊ) | (0) | - |
| <u>මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u> | | |
| දේශීය ණය ගැනීම් | - | - |
| විදේශීය ණය ගැනීම් | - | - |
| ප්‍රදානයන් ලැබීම් | - | - |
| මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ) | - | - |
| <u>අඩුකළා : මුදල් වැය කිරීම්</u> | | |
| දේශීය ණය ආපසු ගෙවීම් | - | - |
| විදේශීය ණය ආපසු ගෙවීම් | - | - |
| මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ) | - | - |
| මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ) | - | - |
| මුදල්වල ශුද්ධ වෙනස්වීම (ඔ) = (උ)+(ඒ) | - | - |
| ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය | - | - |
| දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය | - | - |

3

ඒ.එල්. මහරූෆ්
ප්‍රධාන ගණකාධිකාරී
අම්පාර දිසාපති වෙනුවට

3.4 **මූල්‍ය ප්‍රකාශ සටහන්**

ඒසිජ් - 1

## 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශනය

ආදායම් ගණන් දීමේ නිලධාරී :දිස්ත්‍රික් ලේකම්                    වියදම් ශීර්ෂ අංකය : 270

රු.

| ආදායම් සංකේතය | ආදායම් විස්තරය | සටහන | ආදායම් ඇස්තමේන්තුව (1) | | ආදායම් රැස්කිරීම (2) | | | (3) | ආදායමෙන් ආපසු ගෙවීම (4) | | | (5) |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | මූලික ඇස්තමේන්තුව | සංශෝධිත ඇස්තමේන්තුව | අදාළ අමාත්‍යාංශය /දෙපාර්තමේන්තුව විසින් රැස්කිරීම | වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු විසින් රැස්කිරීම (SA-21-1) | එකතුව | හිඟ ආදායම් රැස්කිරීම | මුදලින් | වැරදි නිවැරදි කිරීම | එකතුව | ශුද්ධ ආදායම |
| | | | 1(i) | 1(ii) | 2(i) | 2(ii) | 2(iii) = 2(i)+2(ii) | (3) | 4(i) | 4(ii) | 4(iii) = 4(i)+ 4(ii) | 5=2 (iii)+ (3)- 4(iii) |
| | | | | | අදාල නොවේ | | | | | | | |

2026.02.06
දිනය

ප්‍රධාන ගණකාධිකාරි
ඒ.එල්.මහරුෆ්
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය -අම්පාර

ඒ.එල්. මහරූෆ්
ප්‍රධාන ගණකාධිකාරී
අම්පාර දිසාපති වෙනුවට

ආදායම් ගණන්දීමේ නිලධාරී
චින්තක අබේවික්‍රම
දිස්ත්‍රික් ලේකම්-අම්පාර

චින්තක අබේවික්‍රම
දිස්ත්‍රික් ලේකම්/දිසාපති
අම්පාර දිස්ත්‍රික්කය

# 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම

වියදම් ශීර්ෂ අංකය :270

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම :දිස්ත්‍රික් ලේකම් කාර්යාලය අම්පාර

රු.

| වැය විෂය | සටහන | මූල්‍යකරණ සංකේත අංකය | ප්‍රතිපාදනය: වාර්ෂික ඇස්තමේන්තු ප්‍රතිපාදන (1) | අතිරේක ඇස්තමේන්තු ප්‍රතිපාදන (2) | මු.රෙ. 66/69 මාරු කිරීම (3) (-)/+ | මුළු ශුද්ධ ප්‍රතිපාදන (4)=(1)+(2)+(3) | වියදම: මුදල් පොතට අනුව වියදම් (5) | මු.රෙ. 208 යටතේ අනෙකුත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු විසින් දැරූ වියදම් (සංචිත ගිණුම් සටහන් අනුව) (6) | මුළු වියදම (7)= (5)+(6) | ශුද්ධ ඉතිරිය: ඉතිරිය / (ඉක්මවීම) (8)=(4)-(7) | ඉතිරිය / (ඉක්මවීම) සංශෝධිත ප්‍රතිපාදනයේ % ලෙස (9)=(8)/(4)*100 | විචලනයන් සඳහා හේතු |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| **පුනරාවර්තන වියදම්** | | | | | | | | | | | | |
| වැඩසටහන (1) | | | | | | | | | | | | |
| වැඩසටහන/ව්‍යාපෘතිය/උප ව්‍යාපෘතිය/වැය විෂය අංකය | | | | | | | | | | | | |
| වැය විෂය අනුව වර්ගීකරණය කරන ලද වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ | 5 | | | | | | | | | | | |
| **පුද්ගල පඩිනඩි** | | | **2,061,500,000** | **287,680,000** | **(1,500,000)** | **2,347,680,000** | **2,320,544,264** | **5,924,800** | **2,326,469,064** | **21,210,936** | | |
| 1001 වැටුප් හා වේතන | | 11 | 1,129,000,000 | 287,680,000 | 120,000,000 | 1,536,680,000 | 1,533,063,589 | | 1,533,063,589 | 3,616,411 | 0 | ඉතිරිය ඉතිරි කිරීම |
| 1002 අතිකාල හා නිවාඩු දින වැටුප් | | 11 | 44,500,000 | | 11,500,000 | 56,000,000 | 55,525,828 | | 55,525,828 | 474,172 | 1 | වියදම් පාලනය කිරීම |
| 1003 වෙනත් දීමනා | | 11 | 888,000,000 | | (133,000,000) | 755,000,000 | 731,954,847 | 5,924,800 | 737,879,647 | 17,120,353 | 2 | වියදම් පාලනය කිරීම |
| වැය විෂය අනුව වර්ගීකරණය කරන ලද අනෙකුත් සංචරණ හා ගමන් | 6 | | | | | | | | | | | |
| **සංචාරක වියදම්** | | | **24,300,000** | - | **1,500,000** | **25,800,000** | **24,452,375** | - | **24,452,375** | **1,347,625** | | |
| 1101 දේශීය | | 11 | 24,300,000 | | 1,500,000 | 25,800,000 | 24,452,375 | | 24,452,375 | 1,347,625 | 5 | වියදම් පාලනය කිරීම |
| එකතුව (අ) | | | **2,085,800,000** | **287,680,000** | - | **2,373,480,000** | **2,344,996,639** | **5,924,800** | **2,350,921,439** | **22,558,561** | | |
| **සැපයුම්** | | | **93,800,000** | - | - | **93,800,000** | **68,481,438** | - | **68,481,438** | **25,318,562** | | |
| 1201 ලිපිද්‍රව්‍ය හා කාර්යාලීය අවශ්‍යතා | | 11 | 36,500,000 | | | 36,500,000 | 32,609,054 | | 32,609,054 | 3,890,946 | 11 | වියදම් පාලනය කිරීම |
| 1202 (002) ඉන්ධන ප්‍රවාහන සඳහා ඉන්ධන දීමනා | | 11 | 19,100,000 | | | 19,100,000 | 14,452,062 | | 14,452,062 | 4,647,938 | 24 | වියදම් පාලනය කිරීම |
| 1202 (009) ජංගම සේවා සඳහා ඉන්ධන | | 11 | 21,000,000 | | | 21,000,000 | 10,536,831 | | 10,536,831 | 10,463,169 | 50 | වියදම් පාලනය කිරීම |
| වත්කම් කේතය | කේත විස්තරය | 31.12.2025 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය | 31.12.2025 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය | ඉදිරියේ දී ගිණුම්කරණයට නියමිත | ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම |
|---|---|---|---|---|---|
| 9151 | ගොඩනැගිලි හා ව්‍යුහයන් | 1,567,983,741 | 1,567,983,741 | - | 100% |
| 9152 | යන්ත්‍රෝපකරණ | 728,305,754 | 728,305,754 | - | 100% |
| 9153 | ඉඩම් | 1,681,809,000 | 1,681,809,000 | - | 100% |
| 9154 | අස්පෘශ්‍ය වත්කම් | - | - | - | - |
| 9155 | ජීව විද්‍යාත්මක වත්කම් | - | - | - | - |
| 9160 | කෙරීගෙන යන වැඩ | 208,440,654 | 208,440,654 | - | 100% |
| 9180 | බදු දෙන ලද වත්කම් | - | - | - | - |

### 3.9 **විගණකාධිපතිවරයාගේ වාර්තාව**

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. EPCG/AM/A/Dist.Sec./02/2025/01    ඔබේ අංකය / உமது இல. / Your No.    දිනය / திகதி / Date 2026 මැයි 27 දින.

ගණන්දීමේ නිලධාරී,
අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

**ශීර්ෂය 270 - අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව**

---

යථෝක්ත වාර්තාව සහ පරීක්ෂා කරන ලද මූල්‍ය ප්‍රකාශන මේ සමඟ ඉදිරිපත් කරමි.

එම්.ජී. මදරසිංහ
නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

පිටපත:- අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව, මහා භාණ්ඩාගාරය, කොළඹ-1

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34   +94 11 2 88 72 23   ag@auditorgeneral.gov.lk   www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. EPCG/AM/A/Dist.Sec./02/2025/01    ඔබේ අංකය / உமது இல. / Your No.    දිනය / திகதி / Date 2025 මැයි 17 දින

ගණන්දිමේ නිලධාරී,
අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය.

**ශීර්ෂය 270 - අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 270 - අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2025 අංක 19 දරන ජාතික විගණන (සංශෝධිත) පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගණන්දිමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව නිකුත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය ප්‍රකාශ කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම්, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම් යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව    இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.    No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34    +94 11 2 88 72 23    ag@auditorgeneral.gov.lk    www.naosl.gov.lk

### 1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 දෙසැම්බර් 17 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 අනුව අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

### 1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 දෙසැම්බර් 17 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 ට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

### 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරි නිලධාරී දැනුවත් කරමි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 පුනරාවර්තන වියදම්

අඩ්ඩාලච්චේන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් පුනරාවර්තන වියදම් යටතේ ඇති ගොඩනැගිලි නඩත්තු ප්‍රතිපාදන භාවිතා කරමින් ප්‍රාග්ධන වියදමක් වන රු.349,000 ක් වටිනා ගබඩා රාක්ක මිලදීගෙන තිබුණි.

### 1.6.2 මූල්‍ය නොවන වත්කම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) SA – 82 සමුච්චිත මූල්‍ය නොවන වත්කම් වාර්තාව අනුව සමාලෝචිත වර්ෂය තුළ මිලදීගැනීම් වටිනාකම රු.91,048,697 ක් වුවද මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය තුළ එම වටිනාකම රු.90,927,688 ක් රු.121,009 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) 9152 - යන්ත්‍රෝපකරණ වත්කම් ගිණුමෙහි සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වටිනාකම රු.731,896,180 ක් වුවද භාණ්ඩාගාර මුද්‍රිත SA – 80 අනුව එම වටිනාකම රු.728,305,754 ක් ලෙස රු.3,590,426 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) 2025 දෙසැම්බර් 17 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 හි 03 වන වගන්තියෙහි 3.2 ප්‍රකාරව වාර්තාකරණ අස්ථිත්වයෙහි මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති සංඛ්‍යා, අවසාන භාණ්ඩාගාර ගිණුම් ප්‍රකාශනවල දක්වා ඇති ආදායම්, වියදම් සහ ප්‍රධාන ලෙජර් ශේෂය සමඟ එකඟ වන බවට සහතික විය යුතු බවත් මූල්‍ය නොවන වත්කම්, තැන්පතු, අත්තිකාරම් ගිණුම් සහ අනෙකුත් අදාළ ප්‍රධාන ලෙජර් ගිණුම්වල කේවල ශේෂය අදාළ පාලන ලෙජර් ශේෂයට සමාන වන බවටත් සහතික විය යුතු නමුත් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කරන ලද මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි මූල්‍ය නොවන වත්කම්වල වටිනාකම රු.4,186,539,150 ක් ලෙසත් භාණ්ඩාගාර ගිණුම් ප්‍රකාශනවල සමුච්චිත මූල්‍ය නොවන වත්කම් වාර්තාවෙහි වටිනාකම රු.4,190,129,574 ක් ලෙසත් දක්වා තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල  මූල්‍ය නොවන වත්කම් 9152 ට අදාළව සිගාස් පද්ධතියෙන් ලබා ගන්නා ලද වත්කම් අයිතම වටිනාකම රු.170,909,086 ක් වුවද දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කල්මුණ හා අක්කරපත්තු ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් ඉදිරිපත් කරන ලද වත්කම් නිර්මාණය කිරීමේ ගොනුව (Create File) අනුව වටිනාකම රු.155,175,184 ක් වුයෙන් රු.15,743,902 ක වෙනසක් පැවතුණි.

(ඉ) රු.3,000,000 ක් වටිනා පොතුවිල් ප්‍රාදේශීය ලේකම් කාර්යාල ගොඩනැගිල්ල නිවැරදි කාණ්ඩය යටතේ ගිණුම්ගත කර නොතිබුණි.

(ඊ) ඉකුත් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාර මුද්‍රිත මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයේ 9151, 9152 සහ 9153 යන ලෙජර් ගිණුම්වල රු.10,300,563,167 ක ශේෂයත් සමාලෝචිත වර්ෂයේ භාණ්ඩාගාර මුද්‍රිත සමුච්චිත මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයේ ආරම්භක ශේෂය සමඟ සැසඳීමේදී රු.6,341,668,427 ක වෙනසක් පැවතුණි.

(උ) ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් වත්කම් ඉවත් කිරීම් සම්බන්ධව ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයේ රු.65,471,423 ක ඉවත් කිරීම් පැවතියද එම වටිනාකම භාණ්ඩාගාර මුද්‍රිත සමුච්චිත මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයෙහි දක්වා නොතිබුණි.

(ඌ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් කාන්තා සංවර්ධන මධ්‍යස්ථානයේ සහ  කළමනාකරණ පුහුණු මධ්‍යස්ථානයේ ඉඩම්, ගොඩනැගිලි සහ ඉන්වෙන්ටරි ද්‍රව්‍ය තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කර නොතිබුණි.

(එ) දමන, අඩ්ඩාලච්චේන, තිරුක්කෝවිල් යන ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අයත්  ඉඩම් ද පදියතලාව, දමන, පොතුවිල්, ලාහුගල යන ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල නිල නිවාස හා රජයේ නිවාස ද තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කර නොතිබුණි.

(ඒ) 2017 හා 2018 වර්ෂයන්හි දී ඉදිකරන ලද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 15 කට අයත් නිල සෙවණ ගොඩනැගිලි වටිනාකම සහ සමාලෝචිත වර්ෂයේ නිල සෙවණ, සේවා පියස අළුත්වැඩියා කිරීම සහ නවීකරණය කිරීමට අදාළව දරන ලද රු.87,423,093 ක වියදමින් ප්‍රාග්ධනීත විය යුතු වටිනාකම හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

### 1.6.3 කුලී හා වැඩ අත්තිකාරම් සහ කුලී හා වැඩ අත්තිකාරම් සංචිත ගිණුම

අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නව තෙමහල් කාර්යාල ගොඩනැගිල්ලෙහි පස්වන අදියර ඉදිකිරීම වෙනුවෙන් නිකුත් කර තිබූ අත්තිකාරම් මුදලෙහි නොපියවූ ශේෂය වන රු.10,532,235 ක වටිනාකම මූල්‍ය ප්‍රකාශන තුළ දක්වා නොතිබුණි.

**1.6.4 විගණනය සඳහා සාක්ෂි නොවීම**

සමාලෝචිත වර්ෂය තුළ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයෙහි මූල්‍ය නොවන වත්කම් අත්පත් කර ගැනීම් ලෙස රු.90,927,688 ක් දක්වා තිබූ නමුත් එය තහවුරු කර ගැනීම සඳහා විගණනයට සාක්ෂි ඉදිරිපත් නොවුණි.

**1.6.5 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් මුදල් රෙගුලාසි 454(2) ප්‍රකාරව විදුලි උපකරණ පිළිබඳ ලේඛනයක් යාවත්කාලීනව පවත්වාගෙන ගොස් නොතිබුණි.

**2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) විගණනය වෙත ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පහත සඳහන් විගණන නිරීක්ෂණය අනුව ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ අනුරූපී වී නොතිබුණි.

| විගණන නිරීක්ෂණය | මෙම වාර්තාවේ ඡේදයට යොමුව |
|---|---|
| ඉකුත් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාර මුද්‍රිත මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයේ ගිණුම් 03 ක රු.10,300,563,167 ක ශේෂයක් සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂය සමඟ සැසඳීමේදී රු.6,341,668,427 ක වෙනසක් පැවතුණි. | 1.6.2 (ඊ) |

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

| ඉකුත් වර්ෂයට අදාළ වාර්තාවේ ඡේද යොමුව | ක්‍රියාත්මක කර නොතිබුණු නිර්දේශය | මෙම වාර්තාවේ ඡේද යොමුව |
|---|---|---|
| 1.5.3 (අ) | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් කාන්තා සංවර්ධන මධ්‍යස්ථානයේ සහ කළමනාකරණ පුහුණු මධ්‍යස්ථානයේ ඉඩම්, ගොඩනැගිලි සහ ඉන්වෙන්ටරි ද්‍රව්‍ය තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කර නොතිබුණි. | 1.6.2 (උ) |
| 1.5.3 (ආ) | දමන, අඩ්ඩාලච්චේනෙයි, තිරුක්කෝවිල් යන ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අයත් ඉඩම් ද පදියතලාව හා දමන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය දෙකට අයත් නිල නිවාස හා රජයේ නිවාස ද තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කර නොතිබුණි. | 1.6.2 (එ) |

| | | |
|---|---|---|
| 1.5.3 (ඇ) | 2017 හා 2018 වර්ෂයන්හි දී ඉදිකරන ලද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ පහළොවකට අයත් නිල සෙවණ ගොඩනැගිලි වටිනාකම රු.46,422,256ක් මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කර නොතිබුණි. | 1.6.2 (ඒ) |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 වියදම් කළමනාකරණය

වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු 06 ක් විසින් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ලබා දී තිබූ රු.217,462,270 ක ප්‍රතිපාදනවලින් අමාත්‍යාංශ 02 කට අදාළව රු.4,850,000 ක ප්‍රතිපාදන භාවිතා කර නොතිබූ අතර ඉතිරි ප්‍රතිපාදනවලින් සියයට 55 සිට සියයට 73 දක්වා ප්‍රමාණයක් උපයෝජනය කර නොතිබුණි.

### 3.2 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ හා සමාජ සවිබල ගැන්වීමේ අමාත්‍යාංශයේ 2025 ජූලි 25 දිනැති අංක 03/2025 දරන චක්‍රලේඛයේ 02 වැනි ඡේදය ප්‍රකාරව ආබාධිත දීමනාව ලබන ප්‍රතිලාභියෙකුගේ පවුලේ සාමාජිකයන් සංඛ්‍යාව අනුව මාසික ආදායම එක් අයෙකුට රු.16,191 කට වඩා අඩු ප්‍රතිලාභීන් තෝරාගත යුතුව තිබූ නමුත් ඊට පටහැනිව ආලයඩිවෙම්බු ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ප්‍රතිලාභීන් 13 දෙනෙකු හට දීමනා ගෙවීම් කර තිබුණි.

(ආ) ප්‍රාථමික කර්මාන්ත හා සමාජ සවිබල ගැන්වීම් අමාත්‍යාංශයේ 2019 ජූනි 24 දිනැති අංක 1/3/2015 NSPD (ii) දරන චක්‍රලේඛයේ 10 වැනි වගන්තියට අනුව ආබාධිත දීමනා ලබන ප්‍රතිලාභියෙකු මියගිය හොත් එම දීමනාව වහාම නතර කළ යුතු වුවත් ඉරක්කාමම් - 05 ග්‍රාම නිලධාරී වසමේ ප්‍රතිලාභියෙකු මිය යාමෙන් පසු මාස 02 ක් සඳහා රු.20,000 ක් වැඩිපුර ගෙවා තිබුණි.

(ඇ) සමාජ සුභසාධන හා ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යාංශය විසින් 2018 ඔක්තෝබර් 15 වන දින නිකුත් කරන ලද අංක MSW/EL/01/2018 දරන චක්‍රලේඛයේ 2 වන වගන්තියේ 2.6 ඡේදය ප්‍රකාරව ප්‍රතිලාභියෙකු මියගොස් ඇත්නම් ඔහුට හෝ ඇයට අදාළ දීමනා ගෙවීම් නතර කළ යුතු වුවත් අඩ්ඩාලච්චේන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් වැඩිහිටි දීමනා ලබාගත් ප්‍රතිලාභීන් 04 දෙනෙකු මිය යාමෙන් පසුවද රු.47,000 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි.

(ඈ) ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ හා සමාජ සවිබල ගැන්වීම් අමාත්‍යාංශයේ වැඩිහිටියන් සඳහා වූ ජාතික ලේකම් කාර්යාලය විසින් 2025 මාර්තු 12 දිනැති NSE/DEV/03/01 දරන ලිපිය මගින් නිකුත් කරන ලද වැඩිහිටි දීමනා ගෙවීමේ උපදෙස්වලට අනුව සුබසාධන ප්‍රතිලාභ මණ්ඩලය හරහා අස්වැසුම ගිණුම මගින් දීමනා ලබන ප්‍රතිලාභීන් සඳහා තැපැල් කාර්යාලය මගින් සිදුකරන ගෙවීම් නතර කළ යුතු වුවද ප්‍රාදේශීය ලේකම් කාර්යාල 05 ක් මගින් තැපැල් කාර්යාලය හරහා වැඩිහිටි දීමනා ලබාගත් ප්‍රතිලාභීන් 72 දෙනෙකුට අදාළව රු.994,000 ක මුදලක් ද්විත්ව ගෙවීම් ලෙස ලබාගෙන තිබූ අතර එම මුදල අයකරගෙන අදාළ අමාත්‍යාංශය වෙත නැවත ලබා දීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන සුබසාධන ප්‍රතිලාභ මණ්ඩලය විසින් 2023 ජූලි 13 වන දින නිකුත් කරන ලද අංක ASW/WBB/02/notice/D/DIV/2022 දරන ලිපියට අනුව, අස්වැසුම ප්‍රතිලාභ ලැබීමට සුදුසුකම් ඇති තනි පුද්ගලයෙකුගෙන් පමණක් සමන්විත පවුලක එම පුද්ගලයා මිය ගියහොත්, ග්‍රාම නිලධාරීන් විසින් කරුණු තහවුරු කර ප්‍රතිලාභියා පිළිබඳ විස්තර ප්‍රාදේශීය ලේකම්වරයාගේ නිර්දේශය ඇතිව සුබසාධන මණ්ඩලය වෙත දැනුම් දිය යුතුය. කෙසේ වෙතත්, මියගිය ප්‍රතිලාභීන්ගේ දත්ත සුබසාධන ප්‍රතිලාභ මණ්ඩලය වෙත ලබා දී අදාළ ගෙවීම් නියමිත වේලාවට අත්හිටුවීමට පියවර නොගැනීම හේතුවෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04 ක් මගින් ප්‍රතිලාභීන් 32 දෙනෙකු සඳහා ඔවුන්ගේ බැංකු ගිණුම් වෙත රු.1,357,500 ක මුදලක් ගෙවා තිබුණි.

(ඊ) ප්‍රාදේශීය ලේකම් කාර්යාල 02 ක් විසින් විශ්‍රාම වැටුප් ප්‍රතිලාභීන් වෙත විශ්‍රාම වැටුප් ගෙවීම් කිරීමේ දී මිය ගිය ප්‍රතිලාභීන්ගේ තොරතුරු පද්ධතියට ඇතුළත් කර පද්ධතිය යාවත්කාලීන නොකිරීම හා ප්‍රතිලාභීන්ගේ දෙවන විවාහය මත දීමනාව ප්‍රතිශෝධනය නොකිරීම වැනි හේතූන් මත විශ්‍රාම වැටුප් ප්‍රතිලාභීන් 31 දෙනෙකු වෙත රු.6,796,799 ක මුදලක් වැඩිපුර ගෙවීම් කර තිබුණි.

(උ) පානම සමෘද්ධි බැංකු අංශය යටතේ තිබූ ග්‍රාම නිලධාරී වසම් 07 කට අදාළ සමෘද්ධි ප්‍රතිලාභීන් වෙන් කරමින් 2022 ඔක්තෝබර් 12 වන දින ලාහුගල සමෘද්ධි බැංකුව ස්ථාපනය කර තිබූ නමුත් අදාළ බැංකුව යටතේ ඇති ග්‍රාම නිලධාරී වසම් 07 හි ප්‍රතිලාභීන් 802 දෙනෙකුට අදාළව අනිවාර්ය ඉතිරිකිරීම් සහ පොලී මුදල් ගණනය කර අදාළ ලාහුගල බැංකුව වෙත ලබා දීමට දිස්ත්‍රික් සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව පියවර ගෙන නොතිබුණි.

(ඌ) පානම සමෘද්ධි බැංකුව විසින් සකස් කරන ලද ශේෂ පිරික්සුමෙහි 3310 දරන ගිණුමේ හර ශේෂය පසුගිය වසර 05 ක කාලය තුළ අසාමාන්‍ය ලෙස ඉහළ ගොස් තිබූ අතර 2022/2023 කාලසීමාව තුළ රු.2,763,222 ක අසාමාන්‍ය වර්ධනය සම්බන්ධයෙන් දිස්ත්‍රික් සමෘද්ධි අභ්‍යන්තර විගණන අංශය විසින් විමර්ශනයක් සිදු කර නොතිබුණි.

(එ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2009 මාර්තු 07 දිනැති අංක 2009/8 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ 5 වන පරිච්ඡේදයේ 15 (3) වගන්තියට අනුව ප්‍රජා මූල සංවිධානයක සියලුම අරමුදල් අදාළ ප්‍රජා මූල බැංකුවේ ගිණුමක තැන්පත් කළ යුතු වුවද නින්දවූර් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් ප්‍රජා මූල සංවිධාන 17 ක් විසින් සාමාජික මුදල් ලෙස 2019 වර්ෂයේ සිට විගණන දිනය වන 2025 ඔක්තෝබර් 30 දක්වා එකතු කරන ලද රු.1,100,917 ක මුළු මුදල අදාළ ප්‍රජා මූල සංවිධානවල බැංකු ගිණුම්වල තැන්පත් කර නොතිබුණි.

(ඒ) ප්‍රාදේශීය ලේකම්, දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ, දිස්ත්‍රික් සමෘද්ධි අභ්‍යන්තර විගණන අංශය සහ සමෘද්ධි බැංකු කළමනාකරුවන් විසින් අංක 2009/8 දරන අති විශේෂ ගැසට් පත්‍රය සහ චක්‍රලේඛයන්ට අනුව ප්‍රජා මූල සංවිධාන පිළිබඳව නිසි අවධානයක් යොමු නොකිරීම හේතුවෙන් නින්දවූර් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් ප්‍රජා මූල සංවිධාන 17 ක් විසින් ණය වශයෙන් සාමාජිකයන් අතර ලබා දුන් රු.841,610 ක මුදලක් නැවත අය කරගෙන නොතිබූ අතර රු.259,307 ක මුදලක් භාණ්ඩාගාරිකවරු අත රඳවාගෙන තිබුණි.

(ඔ) ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ සමාජ සවිබල ගැන්වීම් අමාත්‍යාංශයේ ග්‍රාමීය සංවර්ධන වැඩසටහන - 2025 යටතේ අක්කරෙයිපත්තු ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ප්‍රතිලාභීන් සඳහා දෙනුන් ලබාදීමේ ව්‍යාපෘතිය මගින් ප්‍රතිලාභීන් 11 දෙනෙකු වෙනුවෙන් අදියර 02 ක් යටතේ රු.3,689,350 ක් වටිනා කිරි දෙනුන් හා වසු පැටවුන් ලබා දී තිබුණ ද අදාළ සතුන් සඳහා සුදුසු රක්ෂණාවරණයක් ලබාගෙන නොතිබුණි.

(ඔ) ග්‍රාම ශක්ති වැඩසටහන 2018 සිට 2024 වර්ෂය දක්වා කාල පරිච්ඡේදය තුළ ග්‍රාම ශක්ති සමිති සාමාජිකයන් වෙත ලබා දෙන ලද රු.229,992,261 ක ණය මුදලකින් රු.75,314,300 ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් අයකර ගත යුතුව පැවතුණි.

(ක) ග්‍රාම ශක්ති වැඩසටහන සම්බන්ධයෙන් සෞභාග්‍ය සංවර්ධන කාර්යාංශය මගින් නිකුත් කරන ලද අංක SDB/SPV/GS/2022/චක්‍රලේඛ 01 හා 2022 ජුනි 28 දිනැති චක්‍රලේඛය ප්‍රකාරව සක්‍රියව පවතින ග්‍රාම ශක්ති මව් සමිතිවල පවතින මුදල් උපයෝගී කර ගනිමින් ක්ෂුද්‍ර මූල්‍ය ණය වැඩසටහන් සඳහා අත්‍යවශ්‍ය යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා සහ සමිති සාමාජිකයන් සඳහා අත්‍යවශ්‍ය අනෙකුත් වැඩසටහන් සඳහා වන ව්‍යාපෘති සඳහා යොදාගත හැකි වුවද අම්පාර දිස්ත්‍රික්කය තුළ ලියාපදිංචි සමිති 168 අතරින් සක්‍රියව පවතින සමිති 127 ක් චක්‍රලේඛය අනුව තම අරමුදල් භාවිතා නොකර තම බැංකු ගිණුම්වල එකතුව රු.29,139,077 ක මුදලක් නිෂ්කාර්යව රඳවාගෙන තිබූ අතර ලියාපදිංචි මුළු සමිති අතරින් 2026 මාර්තු 31 වන විට අක්‍රිය සමිති 41 ක ඔවුන්ගේ බැංකු ගිණුම් තුළ සාමාජික අරමුදල් හා රජයේ අරමුදල් වශයෙන් රු.1,883,034 ක මුදලක් රඳවාගෙන තිබුණි.

### 3.3 ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදුකර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කරගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදුකර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

### 3.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය | |
| XXIV පරිච්ඡේදයේ 4 වන වගන්තිය | රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම් පිළිබඳ සැසඳුම් ප්‍රකාශය අනුව, සේවය අත්හිට වූ, සේවය අත්හැර ගිය, රෝගී සහ විශ්‍රාම ගිය නිලධාරීන් 19 දෙනෙකුගෙන් සමාලෝචිත වර්ෂයේ අවසාන දින වන විටත් වර්ෂ 01 සිට වර්ෂ 10 ක කාල පරාසයක සිට හිඟ ණය රු.2,268,622 ක් අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි. |

(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය

| | |
|---|---|
| (i) මුදල් රෙගුලාසි 156 | තිරුක්කෝවිල් සහ ලාහුගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල පරිභෝජන භාණ්ඩ ලේඛනයට අදාළ ලේඛන යාවත්කාලීන කර ගබඩාවේ ඇති භාණ්ඩ තොග පරීක්ෂා කිරීමේදී තිරුක්කෝවිල් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් භාණ්ඩ වර්ග 36 ක සහ ලාහුගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් භාණ්ඩ වර්ග 39 ක හිඟයක් පැවති අතර එම භාණ්ඩවල වටිනාකම රු.288,315 ක් අදාළ විෂය භාර නිලධාරීන්ගෙන් අයකර ගෙන නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 385 (අ) | බැංකු ගිණුම් ක්‍රියාත්මකව පවතින අවස්ථාවක රු.500 ක් හෝ ඊට වැඩි ඕනෑම ගෙවීමක් චෙක්පත් මඟින් සිදුකළ යුතු වුවත් ඉරක්කාමම් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් භාෂා පුහුණු සම්පත්දායකයා වෙත රු.80,000 ක මුදලක් ගෙවා තිබුණි. |

(ඇ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ

| | |
|---|---|
| (i) රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ 2009 අප්‍රේල් 16 දිනැති හා අංක 09/2009 දරන චක්‍රලේඛයේ 2 (iv) වගන්තිය | වේලාව පදනම් කර ගනිමින් අතිකාල හා නිවාඩු දින වැටුප් ආදී නිත්‍ය රාජකාරී වේලාවෙන් පසුව ගෙවනු ලබන දීමනා සඳහා කාලය පදනම් කරගන්නේ නම් එම කාලය ඇඟිලි සලකුණු යන්ත්‍රය මඟින් සනාථ කළ යුතු වුවද උහන, දමන සහ නාවිදන්වෙලි යන ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03 ක නිලධාරීන් 19 දෙනෙකු සඳහා ඇඟිලි සලකුණු සටහන් කිරීමකින් තොරව වැටුප් හා නිවාඩු දින දීමනා රු.9,181,543 ක් ලබා දී තිබුණි. |
| (ii) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 09/2009 හි (v) වගන්තිය | ඇඟිලි සලකුණු යන්ත්‍රය හා බැහැර යාමේ ලේඛනයක් භාවිතා නොකර ධාවන සටහන් පත්‍ර මඟින් පමණක් පැමිණීම හා පිටවීම සනාථ කර තිබිය දී ධාවන සටහන් පත්‍ර මත පමණක් පදනම්ව දමන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පරිපාලන ග්‍රාම නිලධාරී වෙත නිවාඩු දින දීමනා හා වැටුප් රු.781,803 ක් ගෙවීම් කර තිබුණි. |

(ඈ) 2024 ප්‍රසම්පාදන අත්පොත හා මාර්ගෝපදේශ සංග්‍රහය

| | |
|---|---|
| (i) ප්‍රසම්පාදන අත්පොතේ 2.9 සහ 3.1.6 වගන්ති | රු.20,000 ඉක්මවන මිලදී ගැනීම සඳහා විධිමත් මිල ගණන් කැඳවිය යුතු වුවත් ඉරක්කාමම් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් සිංහල භාෂා පුහුණු පන්තිය වෙනුවෙන් ආහාර සැපයීම වෙනුවෙන් මිල ගණන් කැඳවීමකින් තොරව රු.30,000 ක් මිලදී ගැනීම් සිදුකර තිබුණි. |

| | |
|---|---|
| (ii) 2.7.6 (iv) වගන්තිය | ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ට අනුව මිල ගණන් ඇගයීම් කමිටුව සඳහා අවම වශයෙන් අදාළ ප්‍රසම්පාදනයට සෘජුවම සම්බන්ධ විෂය පිළිබඳ ප්‍රවීණත්වයක් ඇති සාමාජිකයෙකු ඇතුළත් කරමින් ඇගයීම් කටයුතු සිදුකළ යුතු බව සඳහන් වුවත් තිරුක්කෝවිල් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් එම ක්‍රියා පටිපාටිය අනුගමනය නොකරමින් දින 04 ක් වැනි කෙටි කාලයක් ඇතුළත ලබාගත් ප්‍රසම්පාදන කමිටු තීරණ මත පදනම්ව යන්ත්‍ර සූත්‍ර 09 ක් මිලදීගෙන සැපයුම්කරු වෙත රු.3,788,999 ක් ගෙවීම් සිදුකර තිබුණි. |
| (iii) ප්‍රසම්පාදන අත්පොතෙහි 03 වන සහ 06 වන පරිච්ඡේද සහ ප්‍රසම්පාදන මාර්ගෝපදේශවල 3.1.5 සහ 6.1 යන වගන්ති | සමාලෝචිත වර්ෂය තුළ තිරුක්කෝවිල් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් Singer ලැප්ටොප් පරිගණක 02 ක් අක්කරෙයිපත්තු Singer Sri Lanka PLC ආයතනයෙන් රු.619,999 ක් මිලදීගෙන තිබූ නමුත් ප්‍රසම්පාදන අත්පොතෙහි යොමුගත නියමයන් සහ ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලට පටහැනිව තාක්ෂණික පිරිවිතරයන් සහ අනුකූලතාවය නිසි පරිදි සකස් කිරීමකින් තොරව අදාළ මිලදීගැනීම් සිදුකර තිබුණි. |
| (ඉ) 1947 අංක 08 දරන (464 වන අධිකාරය වූ) රජයේ ඉඩම් ආඥාපනතේ 19 (2) වගන්තිය | ලාහුගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ග්‍රාම නිලධාරී වසම් 12 ක පුද්ගලයින් 395 දෙනෙකු වෙත තාවකාලික ඇගයීමක් මත පදනම්ව ඉඩම් බලපත්‍ර නිකුත් කර තිබූ අතර එම බලපත්‍රලාභීන්ගෙන් අයවිය යුතු රු.4,389,000 ක් හිඟ ඉඩම් බදු ආදායම් අයකර ගැනීමට හෝ බදු මුදල් නොගෙවන පුද්ගලයන්ට එරෙහිව ඉඩම් සංවර්ධන ආඥා පනතේ විධිවිධාන ප්‍රකාරව නීතිමය පියවර ගැනීමට කටයුතු කර නොතිබුණි. |

### 3.5 කොන්ත්‍රාත් සම්බන්ධයෙන් බදු අයකර ගැනීම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ප්‍රසම්පාදන අත්පොත - 2024 හි 9.1( උ) වගන්තියට අනුව එකතු කළ අගය මත බද්ද සඳහා ලියාපදිංචි වී ඇති කොන්ත්‍රාත්කරුවන්ට බදු ගෙවීමේ දී අදාළ බදු ලියාපදිංචි අංකය සහිත විධිමත් බදු ඉන්වොයිසි ඉදිරිපත් කළ යුතු වුවත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 09 ක් මඟින් සිදු කරන ලද ගිවිසුම්ගත වැඩ වෙනුවෙන් රු.21,327,320 ක මුළු බදු මුදලක් කොන්ත්‍රාත්කරුවන් 45 දෙනෙකු වෙත ගෙවා තිබුණ ද, ඒ සඳහා වන බදු ඉන්වොයිසි අදාළ කොන්ත්‍රාත්කරුවන්ගෙන් ලබාගෙන නොතිබුණි.

(ආ) ප්‍රසම්පාදන අත්පොත - 2024 හි 5.13 සහ 9.1 (උ) වගන්තීන් අනුව කොන්ත්‍රාත්කරුවන් වෙත එකතු කළ අගය මත බද්ද ගෙවූ වහාම ඒ පිළිබඳ විස්තර දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා වෙත දැනුම් දිය යුතු වුවත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 10 ක කොන්ත්‍රාත්කරුවන් 51 දෙනෙකු වෙනුවෙන් ගෙවන ලද රු.15,415,404 ක මුළු බදු මුදලට අදාළ විස්තර දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත දැනුම් දී නොතිබුණි.

(ඇ) ප්‍රසම්පාදන අත්පොත - 2024 හි 9.1(උ) වගන්තියට අනුව කොන්ත්‍රාත්කරුවන් වෙත රඳවා ගැනීමේ මුදල් නිදහස් කිරීමේදී එම මුදලට අදාළ එකතු කළ අගය මත බද්ද එකතු කර ගෙවිය යුතු බවට දක්වා තිබුණ ද සම්මන්තුර, අක්කරපත්තුව සහ සයින්දමරුදු යන ප්‍රාදේශීය ලේකම් කාර්යාල මඟින් සිදු කරන ලද ගිවිසුම්ගත වැඩ සඳහා කොන්ත්‍රාත්කරුවන් 13 දෙනෙකුගේ රඳවා ගැනීමේ මුදල් ලෙස තැන්පත් කර තිබූ රු.8,625,994 ක මුළු මුදලට අදාළ රු.1,552,678 ක එකතු කළ අගය මත බද්ද එම රඳවා ගැනීමේ මුදල් නිදහස් කිරීමට පෙරම ගෙවා තිබුණි.

### 3.6 තැන්පතු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සායින්දමරුදු ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ 2023 ඔක්තෝබර් 03 වන දින සිට පවතින රු.9,900 ක තැන්පතු ශේෂය සඳහා මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ආ) 2023 වර්ෂයේදී උහන ප්‍රාදේශිය ලේකම් කාර්යාලයට අදාළ ව්‍යාපෘතියක් වෙනුවෙන් ලද රු.1,000,000 ක් අදාළ අරමුණ සඳහා භාවිතා කිරීමකින් තොරව වසර 02 කට අධික කාලයක් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ තැන්පතු ගිණුමේ රඳවාගෙන තිබුණි.

(ඇ) අඩ්ඩාලච්චේන ප්‍රාදේශිය ලේකම් කාර්යාලය වෙත කොට්ඨාසයේ පාසලක් සඳහා ඉඩමක් අත්පත් කර ගැනීම වෙනුවෙන් පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවෙන් ලබා දී තිබූ රු.6,500,000 ක් අදාළ කාර්යය සඳහා උපයෝජනය නොකර තැන්පත් ගිණුමෙහි වර්ෂ 06 ක කාලයක සිට රඳවාගෙන තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

#### 4.1.1 ප්‍රධාන කාර්යයන්ට පටහැනි ක්‍රියාකාරකම්

ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශයේ මඟපෙන්වීම යටතේ ජනාධිපති ලේකම් කාර්යාලය විසින් නිකුත් කරන ලද 2025 නොවැම්බර් 13 දිනැති PS/DAD/SA/02/10/2-1 දරන ලිපිය සහ අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2025 නොවැම්බර් 13 දිනැති AMP/GA/PLAN/07/PRDGSH/11/1 දරන ලිපියට අනුව වෙන්කරන ලද රුපියල් මිලියනයක ප්‍රතිපාදනවලින් මිලදී ගත යුත්තේ ලැප්ටොප්, ඩෙස්ක්ටොප්, මුද්‍රණ යන්ත්‍ර, බහුකාර්ය මුද්‍රණ යන්ත්‍ර, බහුමාධ්‍ය ප්‍රක්ෂේපණ යන්ත්‍ර සහ ශබ්ද පරිපාලන පද්ධති පමණක් ලබාගත යුතු බවට උපදෙස් දී තිබුණ ද ඊට පටහැනිව ලාහුගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් රු.508,000 ක වටිනාකමකින් යුත් උපකරණ මිලදීගෙන තිබුණි.

#### 4.1.2 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන අමාත්‍යාංශය යටතේ උහන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සඳහා වැල් දොඩම් වගා කිරීමේ ව්‍යාපෘතියක් වෙනුවෙන් රු.2,050,000 ක ප්‍රතිපාදන ලබා දී තිබූ නමුත් අදාළ ව්‍යාපෘතිය ඉටු කිරීමට පෙර යෝග්‍ය පරිදි ශක්‍යතා අධ්‍යයනයක් සිදුකර අරමුණු ඉටුකර ගන්නා ආකාරය පිළිබඳව මෙන්ම ව්‍යාපෘතියේ පසු විපරම් කටයුතු සිදුකළ යුතු ආකාරය පිළිබඳව අවධානය යොමු නොකිරීම හේතුවෙන් ව්‍යාපෘතියේ අපේක්ෂිත අරමුණු ළඟා කරගෙන නොතිබුණි.

### 4.1.3 අපේක්ෂිත ප්‍රතිලාභ ලබා නොගැනීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පොතුවිල් Blue Flag Beaches සංවර්ධන ව්‍යාපෘතිය - 2025 යටතේ රු.2,708,860 ක පිරිවැයක් දරමින් සංචාරකයන් සඳහා තොරතුරු ලබාදීමේ මධ්‍යස්ථානයක් පොතුවිල් ප්‍රාදේශීය ලේකම් කාර්යාල පරිශ්‍රය තුළ ස්ථාපනය කර තිබූ නමුත් ප්‍රධාන සංචාරක කලාපය වන ආරුගම්බේ සංචාරක මධ්‍යස්ථානය පිහිටි ස්ථානය සහ මෙම ගොඩනැගිල්ල ඉදිකර ඇති ප්‍රාදේශීය ලේකම් කාර්යාල පරිශ්‍රය අතර කිලෝමීටර් 4 ක පමණ දුරක් පැවතීම හේතුවෙන් සංචාරකයන්ට තොරතුරු සැපයීමේදී දුෂ්කරතා පවතින අතර වැඩ නිම කරන ලද මෙම ගොඩනැගිල්ල අදාළ අරමුණ සඳහා භාවිතා නොකර නිෂ්කාර්යව පැවතුණි.

(ආ) ග්‍රාමීය මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය යටතේ ලාහුගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් අබේසිංහපුර මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීමේ කටයුතු රු.4,524,330 ක කොන්ත්‍රාත් වටිනාකමකට ගිවිසුම්ගතව AS Construction ආයතනය විසින් ඉදිකිරීම් කටයුතු නිම කර තිබූ නමුත් මාර්ගයේ තාර යෙදීමේ කටයුතු සඳහා රු.208,498 ක් ගෙවීම් කර තිබුණ ද මාර්ගයට සම්පූර්ණයෙන්ම තාර යෙදීම නිසි ප්‍රමිතියෙන් යුතුව සිදුකර නොතිබුණි.

(ඇ) 2020 වර්ෂයේදී සංචාරක අමාත්‍යාංශයේ ප්‍රතිපාදන යටතේ ලාහුගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් පානම ග්‍රාම නිලධාරී වසම තුළ රු.11,831,392 ක වියදමින් පාරම්පරික ආහාර අංගනයක් ඉදිකර තිබූ නමුත් එම ගොඩනැගිල්ල සංචාරකයින්ට උචිතවන පරිදි සහ ව්‍යාපෘතියේ මූලික අරමුණු ඉටුවන පරදි සකස් කර භාවිතයට ගෙන නොතිබුණි.

(ඈ) 2024 ජනාධිපති විශේෂ වැඩසටහන යටතේ කල්මුණේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ රුපියල් මිලියන 4.9 ක ප්‍රතිපාදන යටතේ නට්පිට්ටිමුනෙයි – 03 ග්‍රාම නිලධාරී වසමේ ළමා උද්‍යානයක් ඉදිකිරීම සඳහා කල්මුණේ මහා නගර සභාවේ නියෝජිතත්වයෙන් නට්පිට්ටිමුනෙයි – 03 සංවර්ධන සමිතිය සමඟ ගිවිසුම්ගතව අදාළ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර තිබුණි. එම ව්‍යාපෘතියේ සියලුම වැඩකටයුතු නිම කර ඇති බවට අදාළ ග්‍රාම සංවර්ධන සමිතිය විසින් සකස් කරන ලද බිල්පත් කල්මුණේ මහා නගර සභාව විසින් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබුණි. ඒ අනුව අවසාන ගෙවීම ලෙස රු.2,538,548 ක වටිනාකමකින් යුත් චෙක්පතක් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ලියා මාස 06කින් පසුව රාජ්‍ය ආදායමට ගෙන තිබූ අතර පස් යොදා ළමා උද්‍යානයේ බිම සකස් කිරීම පමණක් සිදුකර තිබුණි.

(ඉ) 2025 වර්ෂයේ විමධ්‍යගත අයවැය යටතේ රුපියල් මිලියන 3.2 ක් සායින්දමරුදු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් ඇළ මාර්ග සංවර්ධනය කිරීම සඳහා ප්‍රතිපාදනය කර තිබූ අතර මෙම ව්‍යාපෘතිය යටතේ ඇළ මාර්ග පිරිසිදු කිරීමේ කටයුතු සඳහා ආදම්බාවා ඇන්ඩ් සන්ස් ආයතනය සමඟ රු.2,703,035 ක වටිනාකමකට ගිවිසුම්ගත වී තිබුණි. වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ තාක්ෂණික උපදෙස් හා කල්මුණේ මහා නගර සභාවේ අධීක්ෂණය යටතේ මෙම වැඩ කටයුතු ඉටු කළ බවට දක්වා තිබූ නමුත් එම ඇළ මාර්ග ප්‍රදේශය නැවතත් විශාල වශයෙන් කුණු කසළ, ප්ලාස්ටික් අපද්‍රව්‍ය සහ සැල්විනියා වැනි ජලජ පැලෑටිවලින් පිරී තිබුණි.

### 4.1.4 ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පොතුවිල් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් Blue Flag Beaches සංවර්ධන ව්‍යාපෘතිය - 2025 යටතේ පොතුවිල් ජීවිතාරක්ෂක කුළුණ ප්‍රතිසංස්කරණය කිරීම සඳහා රු.3,196,459 ක සමස්ත වටිනාකමකින් යුත් වැඩකටයුතු ස්වකීය සේවකයන් යොදා වැඩ කිරීමේ ප්‍රසම්පාදන ක්‍රමවේදය හරහා ක්‍රියාත්මක කිරීමට පොතුවිල් විශේෂ කාර්ය බලකාය සමඟ ගිවිසුම්ගතව තිබූ අතර මාස 03 ක ගිවිසුම් කාල සීමාව අවසන් වී දින 40 ක් ගත වී තිබියදීත් රු.683,322 ක් වටිනා ප්‍රතිසංස්කරණ කටයුතු සිදුකර නොතිබුණි.

(ආ) ලාහුගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් උතුරු සහ නැගෙනහිර පළාත් පුනරුත්ථාපන වැඩසටහන - 2025 යටතේ සංවර්ධන ව්‍යාපෘති 03 ක් සඳහා ගිවිසුම් අත්සන් කර තිබූ අතර එම ව්‍යාපෘති 2025 දෙසැම්බර් 31 දිනට පෙර නිමකළ යුතුව තිබුණ ද අදාළ ව්‍යාපෘති අවසන් කර නොතිබුණි. තවද එම සංවර්ධන ව්‍යාපෘති 03 හි ගිවිසුම් කොන්දේසි අංක 03 ප්‍රකාරව ප්‍රමාද ගාස්තු ලෙස කොන්ත්‍රාත් මුදලින් සියයට 1 බැගින් රු.263,250 ක මුදලක් අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි.

(ඇ) ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ සමාජ සවිබල ගැන්වීම් අමාත්‍යාංශය විසින් අස්වැසුම සුබසාධන ප්‍රතිලාභ නොලබන අඩු ආදායම්ලාභී පවුල් සවිබල ගැන්වීමේ අරමුණින් ලාහුගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත රු.303,000 ක ප්‍රතිපාදන වෙන් කර ප්‍රතිලාභී දායකත්වය ලෙස රු.65,500 ක මුදලක් ලබාගෙන තිබුණ ද අදාළ ප්‍රතිලාභීන් වෙත ජීවනෝපාය උපකරණ ලබා දී නොතිබූ බැවින් වැඩසටහනෙහි අරමුණ ඉටු වී නොතිබුණි.

### 4.1.5 මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති

ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩ සටහන 2025 යටතේ උහන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ බිම්මල් වගා ව්‍යාපෘතියක් සඳහා රු.512,500 ක මුදලක් වැය කර ඇති නමුත් සිදු කරන ලද නියදි පරීක්ෂාවේදී එම ව්‍යාපෘතියකට අදාළ සමස්ත ප්‍රතිලාභීන්ගෙන් සියයට 50 ක පමණ ප්‍රමාණයක් එම ව්‍යාපෘතිය ක්‍රියාවට නංවා නොතිබුණි.

### 4.2 දේශීය අරමුදල් යෙදවූ ව්‍යාපෘති

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) විමධ්‍යගත අයවැය වැඩසටහන - 2025 යටතේ පොතුවිල් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ක්‍රියාත්මක සංවිධාන 02 ක් සඳහා ලබා දුන් රු.1,074,700 ක සමස්ත වටිනාකමකින් යුත් මහන මැෂින් 13 ක් එම සංවිධානවල පොදු අරමුණු වන සාමාජිකයන්ගේ මාසික ආදායම ඉහළ නැංවීම, ස්වයං රැකියා දිරිමත් කිරීම සහ තිරසාර ආර්ථිකයක් තහවුරු කිරීම යන අරමුණු භාවිත නොකර සාමාජිකයන්ගේ පෞද්ගලික නිවෙස්වල නිෂ්කාර්යව පැවතුණි.

(ආ) විමධ්‍යගත අයවැය වැඩසටහන - 2025 යටතේ රු.2,265,000 ක මුදලක් වැය කර අඩ්ඩාලච්චේන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ඔලුවිල් 01 ග්‍රාම නිලධාරී වසමේ "හෙළ බොජුන්" ආහාර අලෙවි කුටි ඉදිකර තිබුණ ද නිසි ශක්‍යතා අධ්‍යනයක් සිදුකර එම අලෙවි කුටි ඉදි නොකිරීම හේතුවෙන් අග්නිදිග විශ්වවිද්‍යාලයේ උතුරු ද්වාරය අසල තාවකාලිකව ස්ථාපනය කර ඇති මෙම අලෙවි කුටි කිසිදු භාවිතයකින් තොරව නිෂ්කාර්යව පැවතුණි.

(ඈ) අඩ්ඩාලච්චේන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩසටහන - 2025 යටතේ අඩ්ඩාලච්චේන 17 ආලංගුලම් ඇඟලුම් නිෂ්පාදකයින්ගේ සංගමය වෙත ඇඟලුම් නිෂ්පාදන ව්‍යාපෘතියක් වෙනුවෙන් රු.3,249,927 ක ප්‍රතිපාදන ලබා දී තිබූ නමුත් රු.492,500 ක් වටිනා ඇඟලුම් අලෙවිකර එම ආදායමින් රු.161,800 ක් අදාළ ගිවිසුමේ 04 වන ඡේදය ප්‍රකාරව සංගමයට අයත් බැංකු ගිණුමේ තැන්පත් නොකර භාණ්ඩාගාරිකවරයාගේ පෞද්ගලික බැංකු ගිණුමක රඳවා තබාගෙන තිබුණි.

(ඈ) ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ සමාජ සවිබල ගැන්වීම් අමාත්‍යාංශයේ ග්‍රාමීය සංවර්ධන වැඩසටහන - 2025 යටතේ අක්කරපත්තු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ තෝරාගත් ප්‍රතිලාභීන් 04 දෙනෙකු උක්ත ව්‍යාපෘතියෙන් ඉවත් වීමෙන් පසුව නව ප්‍රතිලාභීන් තෝරා නොගැනීම හේතුවෙන් රජය විසින් වෙන් කරන ලද රු.775,000 ක මුදලක් භාවිතා නොකර ඉතිරි වී තිබුණි.

(ඉ) විමධ්‍යගත අයවැය - 2025 වැඩසටහන යටතේ අක්කරපත්තුව ප්‍රාදේශීය ලේකම් කාර්යාල පරිශ්‍රය තුළ ව්‍යාපාරික මධ්‍යස්ථානයක් ඉදිකිරීම සඳහා රු.2,800,000 ක මුදලක් වෙන්කර මෙම ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු සිදු කරන ලද අතර ඒ සඳහා රඳවා ගැනීමේ මුදල් හැර එකතු කළ අගය මත බදු ඇතුළුව රු.2,471,548 ක මුදලක් කොන්ත්‍රාත්කරුවන් වෙත ගෙවා ඉදිකිරීම් කටයුතු නිම වී මාස 03 කට වැඩි කාලයක් ගත වී ඇතත් එම ව්‍යාපාරික මධ්‍යස්ථානය කිසිඳු භාවිතයකින් තොරව වසා දමා තිබුණි.

(ඊ) විමධ්‍යගත අයවැය - 2025 වැඩසටහන යටතේ වෙන් කරන ලද රු.3,400,000 ක මුදලින් කල්මුණේ උතුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ග්‍රාම නිලධාරී වසම් 03 ක් වෙනුවෙන් රු.215,000 සහ 178,500 ක් බැගින් මිලදී ගත් ඇඹරුම් යන්ත්‍ර 05 ක් භාවිතයට නොගෙන නිෂ්කාර්යව පැවතුණි.

(උ) 2025 වර්ෂයේදී නිලසෙවණ ගොඩනැගිලි ප්‍රතිසංස්කරණ වැය ශීර්ෂය යටතේ ලැබුණු මූල්‍ය ප්‍රතිපාදන දැනට පවතින නිලසෙවණ ගොඩනැගිලිවල අලුත්වැඩියා කටයුතු සඳහා පමණක් යොදාගත යුතු බවට උපදෙස් ලබා දී තිබිය දී කල්මුණේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් රු.1,970,297 ක් වැයකර නට්පිට්ටිමුනෙයි - 05 ග්‍රාම නිලධාරී වසමේ පවතින නිලසෙවණ නොවන ගොඩනැගිල්ලක ප්‍රතිසංස්කරණ කටයුතු සිදුකර එම වසමෙහිම පිහිටි පෞද්ගලික ඉඩමක රු.1,970,201 ක වියදමින් නව ගොඩනැගිල්ලක් ද ඉදිකර තිබුණි.

(ඌ) කල්මුණේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් නට්පිට්ටිමුනෙයි - 05 ග්‍රාම නිලධාරී වසමේ නිලසෙවණ ගොඩනැගිලි ප්‍රතිසංස්කරණ කටයුතු වෙනුවෙන් රු.1,970,297 ක් ගෙවීම් කර තිබුණ ද අවසාන බිල්පත් වාර්තාවට අනුව ඉටු නොකරන ලද වැඩ අයිතම 06 ක් සහ නිසි පරිදි නිම නොකරන ලද වැඩ අයිතම 02 ක් වෙනුවෙන් එකතු වටිනාකම රු.395,815 ක් ගෙවීම් කර තිබූ අතර ප්‍රතිසංස්කරණය කරන ලද ගොඩනැගිල්ල නිලසෙවණ ගොඩනැගිල්ලක් බවට තහවුරු නොවුනි.

(එ) කල්මුණේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් සෘජු කොන්ත්‍රාත් ලබා දීමේදී ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2024 ප්‍රසම්පාදන අත්පොතෙහි 3.1.9 (අ)(viii) වගන්තිය ප්‍රකාරව කටයුතු නොකර නට්පිට්ටිමුනෙයි - 05 ග්‍රාම සංවර්ධන සමිතිය වෙත 2025 ඔක්තෝබර් 17 සහ 2025 ඔක්තෝබර් 30 යන දිනවල පිළිවෙලින් රුපියල් මිලියන 1.4 ක් සහ රුපියල් මිලියන 2 ක් වටිනා වැඩ දෙකක් සඳහා ගිවිසුම් අත්සන් කර ලබා දී තිබුණි.

(ඒ) විමධ්‍යගත අයවැය - 2025 යටතේ වෙන්කරන ලද රු.1,400,000 ක ප්‍රතිපාදන මඟින් නාවිදන්වෙලි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් සොරික්කල්මුනෙයි - 02 ග්‍රාම නිලධාරී වසමේ ප්‍රතිලාභීන් 14 දෙනෙකු වෙත වටු පැටවුන්, කූඩු, වටු ආහාර, උපකරණ, පුහුණු වියදම් සහ පරිපාලන වියදම් වෙනුවෙන් රු.1,395,610 ක මුදලක් ගෙවා තිබුණි. තෝරාගත් ප්‍රතිලාභීන් 14 දෙනා සඳහා එක් අයෙකුට වටු පැටවුන් 100 බැගින් ලබා දී තිබුණ ද රු.28,560 ක් වටිනා වටු පැටවුන් 336 දෙනෙකු මියගොස් සිටි තිබූ බැවින් මිලදී ගත් මුළු පැටවුන්ගෙන් සියයට 25 ක පමණ ප්‍රමාණයක් මිය යාමට හේතු විගණනයට ඉදිරිපත් නොවුණි.

(ඔ) විමධ්‍යගත අයවැය වැඩසටහන - 2025 යටතේ වෙන් කරන ලද රු.1,000,000 ක මුදලින් නාවිදන්වෙලි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සාලම්බයිකේනි - 04 ග්‍රාම නිලධාරී වසමේ කෙසෙල් පැල ව්‍යාපෘතිය සඳහා ලීටර් 500 ජල ටැංකි සහ අහල් 1 විදුලි මෝටර් තෝරාගත් ප්‍රතිලාභීන් 07 දෙනෙකු වෙත ලබා දී තිබූ අතර ව්‍යාපෘතිය සඳහා මිලදීගන්නා ලද උපකරණවල වෙළඳපොළ මිල ගණන් සමඟ සැසඳීමේ දී උක්ත ප්‍රසම්පාදනයට අදාළව රු.41,300 ක අතිරික්ත ගෙවීමක් සිදුකර තිබුණි.

## 4.3 ප්‍රසම්පාදනයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) දිස්ත්‍රික් සංවර්ධන වැඩසටහන – 2025 යටතේ අක්කරපත්තුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ ඉදිආප්ප නිෂ්පාදන මධ්‍යස්ථානයක් පිහිටුවීම සඳහා අවශ්‍ය යන්ත්‍ර සහ උපකරණ මිලදී ගැනීමට අදාළව රු.1,345,000 ක වටිනාකමකින් යුත් ගෙවීම් වවුචර් සකස්කර චෙක්පත් ලියා අතරඳවාගෙන තිබූ අතර මාස 03 කට අධික කාලයක් ගත වී ඇතත් එම ඉදිආප්ප නිෂ්පාදන යන්ත්‍ර අදාළ සැපයුම්කරුවන් විසින් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත භාර දී නොතිබුණි. අදාල යන්ත්‍ර මිලදී ගැනීම සඳහා Gen Tech Lanka (Pvt) Ltd ආයතනය විසින් රු.500,000 ක් ද M.H. Marketing සැපයුම්කරු විසින් රු.208,000 ක් ද ලෙස මිල ගණන් ඉදිරිපත් කර තිබූ නමුත් වැඩි මිලක් ඉදිරිපත් කරන ලද Gen Tech Lanka (Pvt) Ltd ආයතනය වෙතින් මිලදීගැනීම් සිදුකර තිබීම මත එම ප්‍රසම්පාදන වෙනුවෙන් රු.292,000 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි.

(ආ) ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ සමාජ සවිබල ගැන්වීම් අමාත්‍යාංශයේ ග්‍රාමීය සංවර්ධන වැඩසටහන - 2025 යටතේ අක්කරපත්තු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ප්‍රතිලාභීන් 40 දෙනෙකුගේ ජීවනෝපාය සංවර්ධනය සඳහා පශු සම්පත් වර්ධනය හා කිරි නිෂ්පාදනය වෙනුවෙන් දෙනුන් මිලදී ගැනීමට රු. මිලියන 8.4 ක ප්‍රතිපාදන වෙන් කර තිබූ නමුත් ලංසු ලේඛනයේ 7.4.1 යටතේ දක්වා ඇති කොන්දේසිවලට පටහැනිව ප්‍රතිලාභීන් 03 දෙනෙකු සඳහා රු.850,500 ක් වටිනා වයස අවුරුදු 06 සිට 07 දක්වා වූ දෙනුන් තිදෙනෙකු ලබා දී තිබුණි.

(ඇ) ජාතික වැඩිහිටි ලේකම් කාර්යාලය මඟින් නින්දවූර් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වැඩිහිටියන් සඳහා අවශ්‍ය පහසුකම් සැපයීමට ප්‍රතිපාදිත රු.898,950 ක මුදලින් එකක් රු.20,800 බැගින් අඩි 6' x 3' ප්‍රමාණයේ තේක්ක ඇඳන් 23 ක් මිලදී ගෙන තිබූ අතර එම කාලසීමාව තුළ ඉරක්කාමම් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් සමාන පිරිවිතර යටතේ එක් ඇඳක් රු.16,500 බැගින් මිලදී ගෙන තිබුණි. ඒ අනුව පිරිවිතර සමානවූ භාණ්ඩ වෙනුවෙන් නින්දවූර් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මඟින් රු.98,900 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි.

## 4.4 වත්කම් කළමනාකරණය

ආලයඩිවෙම්බු ප්‍රාදේශීය ලේකම්වරයා වෙත වෙන් කරන ලද වාහනය අනතුරකට ලක්වීම සම්බන්ධයෙන් සිදුකරන ලද මූලික විමර්ශන මත අම්පාර දිස්ත්‍රික් ප්‍රධාන මෝටර් රථ පරීක්ෂකවරයා විසින් ඉදිරිපත් කරන ලද වාර්තාවෙහි අදාළ වාහනයේ අභ්‍යන්තරයේ ඇති වූ බලපෑමක ප්‍රතිඵලයක් ලෙස එම හානිය සිදු වූ බවට වාර්තා කර තිබුණි. නමුත් මොණරෙකු වාහනය ඉදිරියට පැනීම නිසා ඉදිරිපස විදුරුවට හානි සිදු වූ බවට මූලික විමර්ශන කමිටුව වෙත සහ විගණනය වෙත ප්‍රාදේශීය ලේකම් සහ රියදුරු විසින් ප්‍රකාශන  ලබා දී තිබූ නමුත් එම ප්‍රකාශන මෝටර් රථ පරීක්ෂකවරයා විසින් ඉදිරිපත් කරන ලද වාර්තාව සමඟ එකඟ නොවන බැවින් ඊට අදාළ ඉදිරි කටයුතු සිදු කර නොතිබුණි.

## 4.5 පාඩු හා හානි

අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් සද්ධාතිස්සපුර ගබඩාව 2015 සැප්තැම්බර් 21 දින සොරුන් විසින් විවෘත කර භාණ්ඩ රැගෙන යාම නිසා සිදු වූ පාඩුව රු.850,738ක් ලෙස තක්සේරු කර තිබුණ ද සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් නිවැරදිව මූලික විමර්ශනයක් සිදු කර නොතිබුණි.

## 4.6 අනාර්ථික ගනුදෙනු

පහත  සඳහන්  නිරීක්ෂණයන්  කරනු  ලැබේ.

(අ) 2022/2023 මහ කන්නයේ වී මිලදී ගැනීමේ වැඩසටහන හා වී තොග බැහැර කිරීමේ වැඩසටහන සම්බන්ධයෙන් මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද 2023 පෙබරවාරි 09 දිනැති හා අංක  DRD/2023-1 දරන චක්‍රලේඛයේ 4.2 වගන්තිය අනුව වී මිලදී ගැනීමේ දී වන මෙහෙයුම් වියදම් අදාළ මුදල් රෙගුලාසි, චක්‍රලේඛ සහ අනෙකුත් රජයේ අනුමැතීන්ට යටත්ව සිදු කිරීමට දිස්ත්‍රික් ලේකම් විසින් පියවර ගත යුතු වුවත් අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් සාමාන්‍ය ව්‍යාපෘති සඳහා පරිපාලන වියදම් වෙන් කරන පරිදි සමස්ථ ප්‍රතිපාදන මුදල වන රු.3,089,000,000න්  සියයට 1 ප්‍රතිශතයක් ලෙස දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 17 ක් සඳහා රු.30,890,000ක් පරිපාලන වියදම් සඳහා ප්‍රතිපාදන වෙන් කරවා ගනිමින් චක්‍රලේඛයට පටහැනිව නිලධාරීන් විසින් සත්‍ය වශයෙන් දරන ලද වියදම නොසලකා හැර සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුවේ වාචික උපදෙස් මත යැයි සඳහන් කරමින් අම්පාර දිස්ත්‍රික් ලේකම්වරයාගේ සභාපතිත්වයෙන් යුතු කමිටුවක් පත්කර ගනිමින් එම කමිටු තීරණය අනුව අදාළ නිලධාරීන්ගේ මූලික වැටුපෙන් ¼ ක වටිනාකමකට සමාන මුදලක් ඔවුන් ව්‍යාපෘතියට සම්බන්ධව වූ මාස ගණන මත පදනම්ව එකතුව රු.15,580,562 ක් පරිපාලන වියදම් ලෙස 2023 ජූලි මස වන විට ගෙවා අවසන් කර තිබුණි. තවද  උහන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය යටතේ එක් එක් නිලධාරියාගේ මූලික වැටුපෙන් ¼ ක දීමනාවට අමතරව නිවාඩු දින වැටුප්, ගමන් වියදම් හා අතිකාල දීමනා වශයෙන්ද රු.367,181 ක් නිලධාරීන් 16 දෙනෙකු වෙත ගෙවීම් කර තිබුණි.

(ආ) මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද 2023 පෙබරවාරි 09 දිනැති හා අංක DRD/2023-1 දරන චක්‍රලේඛයේ 2.3.2 වගන්තිය අනුව 2022/2023 මහ කන්නයේ වී මිලදී ගැනීමේ වැඩසටහන 2023 මාර්තු හා අප්‍රේල් මාස තුළ දී අවසන් විය යුතු වුවද 2026 මැයි 08 දින වන විටත් අදාළ ගබඩාවන් තුළ ඉතිරිව තිබූ රු.130,656,758 ක වටිනාකමට අදාළ රතු හා සුදු සහල් කිලෝග්‍රෑම් 942,194 ක තොගය සම්බන්ධයෙන්  විධිමත් ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. ඒ අනුව මෙම ව්‍යාපෘතිය අවසන් වී නොතිබිය දී ඒ සම්බන්ධ පරිපාලන වියදම් ලෙස  උක්ත වටිනාකම එම නිලධාරීන් වෙත ගෙවා තිබුණි.

## 4.7 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් සම්මන්තුරේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සඳහා අනුමත කරන ලද කාර්ය මණ්ඩලයට අනුව සංවර්ධන නිලධාරීන් 56 දෙනෙකු අතිරික්තව සිටියදීත් සංවර්ධන නිලධාරීන් 15 දෙනෙකු සඳහා සමාලෝචිත වර්ෂයේ නොවැම්බර් සහ දෙසැම්බර් මාසවලදී රු.259,605 ක මුදලක් අතිකාල දීමනා ලෙස ගෙවා තිබුණි.

(ආ) වැඩිහිටි දීමනාව තැපැල් කාර්යාලය මගින් ලබා ගනිමින් සිටිය දී මියගිය පසු දීමනා අත්හිටුවනු ලැබූ ප්‍රතිලාභීන් 18 දෙනෙකුගේ තොරතුරු විෂයභාර නිලධාරීන් විසින් අස්වැසුම ගිණුම්වලින් ඉවත් නොකිරීම මත ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04 ක් විසින් නැවතත් එම අස්වැසුම ගිණුම හරහා වැඩිහිටි දීමනාව ලබා දී තිබීම හේතුවෙන් රු.610,750 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි.

(ඇ) උහන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ අස්වැසුම ප්‍රතිලාභයෙකු මිය යාමෙන් පසුවද ඔහුගේ ගිණුමට මුදල් බැරකර තිබීම හේතුවෙන් ප්‍රතිලාභියා මිය යාම මත අස්වැසුම ප්‍රතිලාභය සංශෝධනය නොකිරීම නිසා රු.145,000 ක් වැඩිපුර ගෙවා තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ අප්‍රේල් 29 වන දින අනතුරට ලක් වූ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් ටොයෝටා කැබ් රථය රු.269,354 ක් වියදමින් අලුත්වැඩියා කර තිබුණ ද සිදු වූ හානියේ ස්වභාවය මත අදාළ පාර්ශවයන්ගෙන් අයකරගත යුතු මුදල නිර්ණය කර අයකර ගැනීමට මුදල් රෙගුලාසි 105 (2) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. තවද මෙම කැබ් රථය 2025 ඔක්තෝබර් 27 දින නැවත අනතුරට ලක් වී තිබුණ ද ඒ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104 (3) හා (4) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ඉ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් වාහන 04 ක් අනතුරට ලක් වී තිබූ අතර ඉන් 2025 ඔක්තෝම්බර් 07 දින අනතුරට පත් කැබ් රථය හැර ඉතිරි වාහන 03 අලුත්වැඩියා කිරීම වෙනුවෙන් රු.641,723 ක් දරා තිබුණ ද ඒ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104 (4) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ඊ) ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩසටහන - 2025 යටතේ ඉරක්කාමම් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ තෝරාගත් ග්‍රාම නිලධාරී වසම් 11 ක ප්‍රතිලාභීන් 100 දෙනෙකු සඳහා එළු පාලන ව්‍යාපෘතිය වෙනුවෙන් රුපියල් මිලියන 9.75 ක් වෙන්කර අදියර 07 ක් යටතේ රු.10,014,588 ක වටිනාකමකින් යුත් එළුවන් බෙදා දී තිබූ අතර ප්‍රතිලාභීන් 18 දෙනෙකු වෙත ලබා දුන් රු.371,700 ක වටිනා එළුවන් 18 ක් මියගොස් තිබුණ ද ඒ සඳහා රක්ෂණ වන්දි මුදල් ලැබී නොතිබුණි.

(උ) දිස්ත්‍රික් ලේකම්වරයාගේ අංක AMP/GA/PLN/3/RRDP/9/1-2 දරන 2026 ජනවාරි 23 දිනැති ලිපියට අනුව තුරවන්තිය මේඩු මාර්ගය කොන්ක්‍රීට් කිරීමේ කාර්යය දීර්ඝ කිරීමට අනුමැතිය ලබා දී තිබූ අතර මෙම සංවර්ධන කටයුතු නිමකර ඇති බව කල්මුණ උතුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තාක්ෂණ නිලධාරී විසින් සහතික කර නියෝජ්‍ය සැලසුම් අධ්‍යක්ෂ විසින් නිර්දේශකර සහ සහකාර ප්‍රාදේශීය ලේකම් විසින් අනුමත කරන ලද ලේඛන හා ලිපිගොනු ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ගිණුම් අංශයට ඉදිරිපත් කර තිබුණි. මාර්ගයේ ඉදිකිරීම් කටයුතු ආරම්භක අවධියේ පැවති නමුත් සාවද්‍ය ලේඛන සකස් කර අක්‍රමවත් ලෙස භාණ්ඩාගාරයෙන් රු.1,516,873 ක අත්මුදල් ප්‍රතිපාදන ඉල්ලුම් කර තිබුණි.

## 5. මානව සම්පත් කළමනාකරණය

### 5.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය

2025 දෙසැම්බර් 31 දිනට අනුමත සේවක සංඛ්‍යාව 2345 ක් ද, තථ්‍ය සේවක සංඛ්‍යාව 2781 ක් ද වූ අතර කාර්ය මණ්ඩලයේ පවතින පුරප්පාඩු 202 ක් පුරවා ගැනීමට හා 638 දෙනෙකුගෙන් යුතු අතිරික්ත කාර්ය මණ්ඩලය විධිමත් පරිදි අනුමත කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

එම්.පී. මදරසිංහ
නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

එම්.පී. මදරසිංහ.
නියෝජ්‍ය විගණකාධිපති
ජාතික විගණන කාර්යාලය

**04. පරිච්ඡේදය - කාර්ය සාධන දර්ශක**

4.1 **ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)**

| නිශ්චිත දර්ශකය | සත්‍ය නිමැවුම අපේක්ෂිත නිමවුමේ ප්‍රතිශතයක් (%) ලෙස | | | |
|---|---|---|---|---|
| | **100% - 90%** | **75% - 89%** | **50% - 74%** | **0% - 49%** |
| යටිතල පහසුකම් ව්‍යාපෘති නිම කිරීම | 100% | | | |
| සමාජ සුබසාධන සංවර්ධන ව්‍යාපෘති නිම කිරීම | 100% | | | |
| ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘති නිම කිරීම | 100% | | | |
| පරිසර අංශයේ සංවර්ධන ව්‍යාපෘති නිම කිරීම | 100% | | | |

**05.** පරිච්ඡේදය - තිරසාර සංවර්ධන ඉලක්ක (**SDG**) සාක්ෂාත් කර ගැනීමේ කාර්යය සාධනය

**5.1** හඳුනා ගන්නා ලද තිරසර සංවර්ධන අරමුණු දක්වන්න

| **තිරසර සංවර්ධන ඉලක්ක අංකය** | **ඉලක්කය** | **ඉලක්කය/අරමුණ** | **ජයග්‍රහණ දර්ශක** | **මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය** | | |
|---|---|---|---|---|---|---|
| | | | | **0%-49%** | **50%-74%** | **75%-100%** |
| 01 | 1.1 2030 වන විට ලෝකයේ සියලුම ස්ථානවල වෙසෙන පුද්ගලයින්ගේ අන්ත දරිද්‍රතාව තුරන් කිරීම. වර්තමාන තක්සේරු අනුව දිනකට ඩොලර් 1.25 ට වඩා අඩුවෙන් ආදායම් ලබන අය අන්ත දිළිඳු කාණ්ඩයට අයත් වේ.<br><br>1.3 පහළ මට්ටමේ අයද ඇතුළත්ව සියළුම පුද්ගලයින් සම්බන්ධයෙන් ජාතික වශයෙන් සුදුසු වන්නා වූ සමාජ ආරක්ෂණ ක්‍රම ක්‍රියාවට නැංවීම සහ 2030 වන විට දරිද්‍රතාවෙන් පෙළෙන සහ අවදානම් කණ්ඩායම් ප්‍රමාණවත් ලෙස එමගින් ආවරණය වී තිබීම.<br><br>1.4 විශේෂයෙන්ම දරිද්‍රතාවෙන් පෙළෙන සහ අවදානමට ලක්විය හැකි අය ඇතුළුව සියලුම පිරිමින්ට සහ කාන්තාවන්ට 2030 වසර වන විට ආර්ථික සම්පත්, මූලික සේවාවන්, ඉඩම් හිමිකාරීත්වය හා | සියළු තැන්හි පවතින සෑම ආකාරයකම දුගී බව අවසන් කිරීම | i. අම්පාර දිස්ත්‍රික්කයේ ඉරක්කාමම් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ රු. මිලියන 9.9ක වියදමින් දිළිඳු පවුල් 100ක් සඳහා ගෘහස්ථ සත්ත්ව පාලනය සඳහා එළුවන් 300ක් බෙදා දීම සහ අක්කරපත්තුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ රු. මිලියන 8.45ක වියදමින් දිළිඳු පවුල් 40ක් සඳහා කිරි ගවයින් බෙදා දීම.<br><br>ii. ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩසටහන යටතේ රු. මිලියන 46.7ක වියදමින් ව්‍යාපෘති 12ක් ක්‍රියාත්මක කිරීම.<br><br>iii. ප්‍රතිලාභීන් 73,259 ක් සඳහා අස්වැසුම ප්‍රතිලාභ ලබාදීම.<br><br>iv. කෘෂිකාර්මික නිෂ්පාදන ව්‍යාපෘති 04ක් මඟින් ප්‍රතිලාභීන් 127 දෙනෙක් දිරි ගැන්වීම. | | | **100%** |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | පාලනය කිරීම සහ වෙනත් ආකාරයේ දේපළ උරුමයන්, ස්වාභාවික සම්පත්, සුදුසු නව තාක්ෂණය සහ ක්ෂුද්‍ර මූල්‍ය ඇතුළුව මූල්‍ය සේවාවන් සඳහා ප්‍රවේශවීමට සමාන අයිතිවාසිකම් තහවුරු කිරීම.<br><br>1.5 2030 වන විට දරිද්‍රතාවෙන් පෙළෙන්නන්ගේ සහ අවදානමට ලක් විය හැකි තත්වයේ සිටින්නන්ගේ ඔරොත්තු දීමේ හැකියාව වර්ධනය කිරීම සහ ඔවුන් කාලගුණික තත්වයන්ගෙන් ඇති වන්නාවූ හානිකර බලපෑම් ද ආර්ථික සමාජ සහ පරිසරමය වශයෙන් ඇතිවන්නාවූ හානි සහ ආපදාවලට නිරාවරණයවීම ද අඩු කිරීම. | | v. දිස්ත්‍රික් සංවර්ධන වැඩසටහන යටතේ රු. මිලියන 8.67ක වියදමින් ආපදා කළමනාකරණ ව්‍යාපෘති 03ක් පැවැත්වීම.<br><br>vi. දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය කාලගුණය හා සම්බන්ධ ආන්තික සිදුවීම් අවම කිරීම සඳහා කටයුතු කරනු ලබයි. | | | |
| 02 | 2.1 2030 වන විට සාගින්න තුරන් කිරීම සහ විශේෂයෙන්ම ළදරුවන් ද ඇතුළත්ව දරිද්‍රතාවෙන් පෙළෙන සහ අවදානමට ලක්වී තිබෙන ජනතාවට ආරක්ෂාකාරී, පෝෂණයෙන් යුත්, ප්‍රමාණවත් ආහාර වසර පුරා ලබාගැනීමට හැකි බව තහවුරු කිරීම. | සාගින්න නැතිකර, ආහාර සුරක්ෂිතතාවය සහ යහපත් පෝෂණ තත්ත්වයන් දිනාගෙන තිරසර කෘෂිකර්මය ප්‍රවර්ධනය කිරීම. | i. විමධ්‍යගත අයවැය 2025 යටතේ කෘෂි ව්‍යාපෘති සඳහා රු. මිලියන 33.02 ක් වැය කර ආහාර සුරක්ෂිතතාවය සඳහා ව්‍යාපෘති 24 ක් සිදු කිරීම.<br><br>ii. අම්පාර දිස්ත්‍රික්කයේ ගොවීන් 256 ක් සඳහා අක්කර 209.8 ක් ආවරණය වන පරිදි මුං වගා වගා කිරීමට රු. 890,150.03 ක මුදල් ප්‍රතිපාදන යොදවන ලදී. | | | **100%** |
| 03 | 3.1 2030 වන විට ලෝකයේ මාතෘ මරණ ආනුපාතිකය සජීවී උපත් 100,000 කට 70ක් දක්වා අඩු කිරීම.<br><br>3.4. 2030 වන විට බෝ නොවන රෝග නිසා සිදුවන අකල් මරණ, ප්‍රතිකාර මගින් හා වළක්වා ගැනීමේ ක්‍රම මගින් තුනෙන් එකකින් අඩු කර ගැනීම සහ මානසික | නිරෝගීමත් ජීවිත සහතික කර සෑම වයසකම සිටින සෑම සියල්ලන්ගේම සුබසාධනය ප්‍රවර්ධනය කිරීම | i. පෝෂණ අවශ්‍යතා ඇති අඩු ආදායම්ලාභී ගර්භණී කාන්තාවන්ගේ පෝෂණ මට්ටම දරු ප්‍රසූතිය දක්වා හොඳින් පවත්වාගෙන යාම තහවුරු කිරීම සඳහා ගර්භණී කාන්තාවන් 15,581 ක් සඳහා රු. 403,698,100.00 ක මුදලක පෝෂණ වව්චර් ලබා දී ඇත.<br><br>ii. ක්ලීන් ශ්‍රී ලංකා වැඩසටහනට සමගාමීව ප්‍රාදේශීය ලේකම් කාර්යාල පදනම කරගනිමින් ජංගම සෞඛ්‍ය වැඩසටහනක් පැවැත්වීම. | | | **100%** |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | සෞඛ්‍යය සහ යහපැවැත්ම ප්‍රවර්ධනය කිරීම.<br><br>3.5 හානිකර ආකාරයට මධ්‍යසාර භාවිතය සහ අන්තරායකාරී ඖෂධ භාවිතය වැළක්වීමේ ක්‍රියාමාර්ග සහ ප්‍රතිකාර ශක්තිමත් කිරීම. | | iii. ආයුර්වේද දෙපාර්තමේන්තුව විසින් රු. මිලියන 25.486 ක වියදමින් අම්පාර සහ පොතුවිල් ආයුර්වේද රෝහල් සංවර්ධනය කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.<br><br>iv. ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරි, ජාතික ළමාරක්ෂක අධිකාරියේ නිලධාරීන්, වනිතා සංවර්ධන නිලධාරී සහ මුල් ළමාවිය සංවර්ධන නිලධාරීන්ගේ හා රාජ්‍ය නොවන සංවිධානවල සහභෝගය ඇතිව මෙම ඉලක්ක ළඟා කර ගැනීමට කටයුතු කර ඇත.<br><br>රජයේ නවමු වැඩසටහනක් වන "**ඉවත් වෙනු**" යටතේ විෂ මත්ද්‍රව්‍ය පිටුදැකීම හා වැළැක්වීමට විවිධ ව්‍යාපෘති හා දැනුවත් කිරීමේ වැඩසටහන් සිදු කිරීම. | | | |
| 04 | 4.1 2030 වන විට ඵලදායී ඉගෙනුම් ප්‍රතිඵල ලබාගැනීමට හැකි වන ආකාරයෙන් සියලුම ගැහැණු ළමුන් සහ පිරිමි ළමුන් නිදහස්, සමාන සහ ගුණාත්මකභාවයෙන් ඉහළ, ප්‍රාථමික, සහ ද්විතීයික අධ්‍යාපනයක් සම්පූර්ණ කර සිටින බව තහවුරු කිරීම.<br><br>4.2 2030 වන විට සියලුම ගැහැණු ළමුන්ට සහ පිරිමි ළමුන්ට ගුණාත්මක වශයෙන් ඉහළ පූර්ව ළමාවිය සංවර්ධනයට, සත්කාර සේවාවන්ට සහ පූර්ව ප්‍රාථමික අධ්‍යාපනයට ප්‍රවේශ වීමේ අවස්ථාව පැවතීම හා එමගින් ඔවුන් ප්‍රාථමික අධ්‍යාපනයට සූදානම්ව සිටින බව තහවුරු කිරීම. | පරිපූර්ණ, සාධාරණ ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම සහ සැමට ජීවිත කාලය පුරා ඉගෙනුම් අවස්ථාව සැලසීම. | i. පළාත් විශේෂිත සංවර්ධන ප්‍රතිපාදන වැඩසටහන යටතේ රු. මිලියන 534.32 ක ප්‍රතිපාදන මඟින් ව්‍යාපෘති 106 ක් අධ්‍යාපන ක්ෂේත්‍රයේ සංවර්ධනය වෙනුවෙන් සිදු කරන ලදී.<br><br>ii. රු. මිලියන 10.3 ක වියදමින් පාසල් 7ක ක්‍රීඩාංගන අළුත්වැඩියා කිරීම.<br><br>දිස්ත්‍රික්කයේ පවත්වනු ලබන සෑම දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීමකදීම දිස්ත්‍රික් මට්ටමේ නිලධාරීන්, පළාත් මට්ටමේ නිලධාරීන් හා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සාමාජිකයින් සමඟ පාසල් සම්බන්ධයෙන් ඇති වී ඇති ගැටළු පිළිබඳව හා ගුරුවරුන්, දරුවන් සම්බන්ධව ඇතිවන ගැටළු පිළිබඳව සාකච්ඡා කර සුදුසු විසඳුම් ලබා දී අධ්‍යාපනයේ ගුණාත්මකභාවය හා පාසල්වල ගුණාත්මකභාවය තහවුරු කිරීම. | | | **100%** |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 05 | 5.1 කාන්තාවන්ට හා ගැහැණු ළමුන්ට එරෙහිව සියලුම ස්ථානයන්හි සිදුවන්නා වූ සියලුම ආකාරයේ වෙනස්කොට සැලකීම් තුරන් කිරීම.<br>5.2 මානව කුට්ටනය ලිංගික සහ වෙනත් ආකාරයේ දූෂණයන්ද ඇතුළත්ව කාන්තාවන්ට සහ ගැහැණු ළමුන්ට එරෙහිව පොදු සහ පෞද්ගලික ස්ථානයන්හි සිදුවන්නා වූ සියලුම ආකාරයේ ප්‍රචණ්ඩත්වයන් තුරන් කිරීම.<br><br>5.5 දේශපාලන, ආර්ථික, සහ සාමාන්‍ය ජීවිතයේ සියලුම අවස්ථාවන්හි තීරණ ගැනීමේදී කාන්තාවන්ට නායකත්වය සහ සමාන අවස්ථාවන් සැලසීම හා ඵලදායී අන්දමින් සහභාගී වීම තහවුරු කිරීම. | ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය ළඟාකර සියලු කාන්තාවන් සහ ගැහැණු ළමුන් සවිබල ගැන්වීම | i. දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වනිතා සංවර්ධන නිලධාරී සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සේවයේ නියුතු වෙනත් අදාළ නිලධාරීන් මඟින් (උදා:- සමාජ සේවා නිලධාරීන්) කාන්තාවන් හා ගැහැණු දරුවන් සවිබල ගැන්වීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සහ කාන්තාවන් හා ගැහැණු දරුවන් සම්බන්ධ ගැටළු විසඳීම.<br><br>ii. කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සවිබල ගැන්වීමේදී කාන්තා මූලික ව්‍යවසායන් කෙරෙහි අදාළ නිලධාරීන්ගේ අවධානය යොමු කිරීම.<br><br>iii. අඩ්ඩාලච්චේන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ රු. මිලියන 7ක පමණ වියදමින් මිනි ගාමන්ට් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර කාන්තාවන් 20 දෙනෙකුගේ ජීවනෝපාය සංවර්ධනය කිරීම. | | | **100%** |
| 06 | 6.1 2030 වන විට සියලු දෙනාට සමානාත්මතාවයෙන් යුතුව ආරක්ෂාකාරී සහ අඩු මිළකට පානීය ජලය ලබා ගැනීමට හැකි වීම.<br><br>6.2 2030 වන විට සියලුම දෙනාට ප්‍රමාණවත් ලෙස සහ සමානත්වයෙන් යුක්තව සනීපාරක්ෂාව සහ ස්වස්ථතාව | සැමට ජලය සහ සනීපාරක්ෂක පහසුකම් ලබාගැනීම සහ ඒවායේ තිරසර කළමනාකරණය සහතික කිරීම. | i. විමධ්‍යගත අයවැය වැඩසටහන යටතේ දමන ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ කොක්නහර සහ කලුගොල්ල ප්‍රදේශ වල රු. මිලියන 02ක වියදමින් ප්‍රජා ජල ව්‍යාපෘති දෙකක් ආරම්භ කිරීම, ප්‍රති ආශ්‍රැතකරණ ජල පෙරණ පද්ධතියක් ස්ථාපිත කිරීම සහ දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ මහ ලිඳක් ප්‍රතිසංස්කරණය කිරීම.<br><br>ii. නැවත පදිංචි කිරීමේ ව්‍යාපෘතිය යටතේ රු. මිලියන 8.25ක වියදමින් පාරිභෝගිකයන් 273 දෙනෙකුට ජල සම්බන්ධතාවය ලබා දීම.<br><br>iii. ජාතික ජලසම්පාදන හා ජලාපවාහන මණ්ඩලය මගින් රු. මිලියන 249.62ක | | | **100%** |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | ලබා ගැනීමට හැකි වීම සහ එළිමහනේ මළපහ කිරීම තුරන් කිරීම සහ විශේෂයෙන්ම කාන්තාවන්ගේ, ගැහැණු ළමුන්ගේ, සහ අවදානමට ලක්විය හැකි තත්ත්වයේ සිටින පුද්ගලයින්ගේ විශේෂ අවශ්‍යතාවන් කෙරෙහි අවධානය යොමුකිරීම. | | වියදමින් ජල ව්‍යාපෘති 14ක් පමණ ක්‍රියාත්මක කිරීම.<br>iv. සකොසාන් සනීපාරක්ෂක ව්‍යාපෘතිය යටතේ රු. මිලියන 7.40ක වියදමින් ව්‍යාපෘති 17ක් ක්‍රියාත්මක කිරීම.<br>v. නිදන්ගත වකුගඩු රෝගී තත්ත්වයෙන් ආරක්ෂාවීම සඳහා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 6ක ප්‍රතිආශ්‍රැති ජල පිරිපහදු මධ්‍යස්ථාන 25ක් ස්ථාපිත කර ඇති අතර 2025 වර්ෂය සඳහා එම ජල පිරිපහදු විදුලි බිල්පත් පියවීම සඳහා රු. මිලියන 1.205 ක් වැය කර ඇත. | | | |
| 07 | 7.1 2030 වන විට සියලු දෙනාටම අඩු මිලකට ලබා ගත හැකි විශ්වාසදායී නවීන බලශක්ති මූලාශ්‍රවලට ප්‍රවේශ විය හැකිබව තහවුරු කිරීම. | සියල්ලන් සඳහා දැරිය හැකි, විශ්වාසනීය, තිරසර සහ නවීන බලශක්ති සැපයුම සහතික කිරීම. | නැවත පදිංචි කිරීමේ ව්‍යාපෘතිය යටතේ රු. මිලියන 13.88ක වියදමින් විදුලි සම්බන්ධතා 358ක් ලබා දීමට කටයුතු කිරීම. | | | **100%** |
| 08 | 8.3 ඵලදායී ක්‍රියාකාරකම් වලට, සුනිසි රැකියා අවස්ථාවන්ට, ව්‍යවසායකත්වයට සහ නිර්මාණශීලීභාවයට සහාය දක්වන්නා වූ සංවර්ධනාත්මක දිශානතියකින් යුත් ප්‍රතිපත්තීන් ප්‍රවර්ධනය කිරීම. මූල්‍ය සේවාවන්ට ප්‍රවේශ වීමට අවස්ථාව සලසමින් ක්ෂුද්‍ර, කුඩා පරිමාණ සහ මධ්‍යම ප්‍රමාණයේ ව්‍යවසායන් පිහිටුවීම සහ සංවර්ධනය කිරීම දිරිගැන්වීම.<br>8.5 2030 වන විට ආබාධිත පුද්ගලයින් සහ යෞවනයින් ද ඇතුළත්ව සියලුම | සියල්ලන් සඳහාම පෝෂිත සහ පරිපූර්ණ, තිරසර ආර්ථික වර්ධනය, පූර්ණ, ඵලදායී සහ යහපත් රැකියා ප්‍රවර්ධනය කිරීම. | i. කුඩා හෝ මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් 100ක් බිහිකිරීම<br>ii. වනිතා සංවර්ධන නිලධාරි, විදාතා නිලධාරීන්, කුඩා ව්‍යාපාර සංවර්ධන අංශය හා කාර්මික සංවර්ධන මණ්ඩලය මඟින් සියළුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයන් සමඟ එක්ව තමන්ගේ ව්‍යාපාර අදහස් ක්‍රියාත්මක කිරීම සඳහා මුලපිරීමට අවස්ථාව සැලසීම අරමුණු කොට විවිධ පුහුණු හා තොරතුරු වැඩසටහන් රැසක් පවත්වන ලදී. | | | **100%** |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | කාන්තාවන් සහ පිරිමින් සඳහා ඵලදායී සහ සුනිසි රැකියා අවස්ථාවන් ලබාදීම.<br>8.9 2030 වන විට දේශීය සංස්කෘතිය, නිෂ්පාදනය සහ රැකියා අවස්ථාවන් ප්‍රවර්ධනය කරන්නා වූ තිරසර සංචාරක කර්මාන්ත පිළිබඳ ප්‍රතිපත්ති සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම. | | iii. තිරසර සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනයට සමගාමීව රැකියා අවස්ථා බිහිකිරීම සඳහා පොතුවිල් ප්‍රාදේශිය ලේකම් බල ප්‍රදේශය තුළ රු. මිලියන 9.43ක ප්‍රතිපාදන මගින් Blue Flag Beach ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට කටයුතු යොදා ඇත. | | | |
| 09 | 9.1 ආර්ථික සංවර්ධනය සහ මානව යහපැවැත්ම වෙනුවෙන් සියලු දෙනාටම ලබාගත හැකි සහ ප්‍රවේශ විය හැකි වීම අවධානයට ගෙන කලාපීය සහ ජාතික දේශසීමාවන් අතර සිදුකරන යටිතල පහසුකම් ද ඇතුළත්ව ගුණාත්මක වශයෙන් ඉහළ විශ්වාසදායී තිරසර සහ ආපදාවන්ට ඔරොත්තු දෙන යටිතල පහසුකම් සංවර්ධනය කිරීම.<br>9.2 සියලුදෙනාම අන්තර්ගත වන්නා වූ සහ තිරසර වූ කර්මාන්තකරණය ප්‍රවර්ධනය කිරීම, 2030 වන විට ජාතික තත්වයන්ට අනුකූල රැකියාවන් සැපයීමේදී කර්මාන්ත අංශයේ දායකත්වය කැපී පෙනෙන ලෙස ඉහළ නැංවීම සහ අවම වශයෙන් සංවර්ධනය වී ඇති රටවල මෙම දායකත්වය දෙගුණයක් බවට පත් කිරීම. | සවිමත් යටිතල පහසුකම් ගොඩනැගීම, පරිපූර්ණ සහ තිරසර කාර්මීකරණය ප්‍රවර්ධනය කර නව්‍යකරණය දිරිගැන්වීම. | i. මිලියන 270.49ක වියදමින් මාර්ග සංවර්ධන ව්‍යාපෘති 104ක් සහ රු. මිලියන 279.14ක වියදමින් මාර්ග සංවර්ධන ව්‍යාපෘති 127ක් ක්‍රියාත්මක විය.<br>ii. නැවත පදිංචි කිරීමේ ව්‍යාපෘතිය යටතේ රු. මිලියන 71.33ක මුදලින් අභ්‍යන්තර මාර්ග 31ක් පිළිසකර කිරීම. | | | **100%** |
| 10 | 10.1 2030 වන විට ජනගහනයේ පහළ මට්ටමේ සිටින 40% ගේ ආදායම් වර්ධනය ජාතික මට්ටමේ සාමාන්‍ය අගයට වඩා වැඩියෙන් ප්‍රගතිශීලී ලෙස වර්ධනය කිරීම සහ පවත්වාගෙන යාම.<br>10.2 2030 වන විට වයස, ලිංගිකත්වය, ආබාධිතබව, ජන වර්ගය, ජාතිය, ආගම හෝ ආර්ථික හෝ වෙනත් තත්වයන් | රටවල් තුළ සහ ඒවා අතර අසමානතාවය අඩු කිරීම. | i. මේ යටතේ රජයේ විශේෂ සහන වැඩසටහන් ලෙස ක්‍රියාත්මක වන "අස්වැසුම" වැඩසටහන යටතේ විශේෂයෙන් හඳුනාගත් දරිද්‍රතා මට්ටම පහළ මට්ටමේ සිටින පුද්ගලයින් සඳහා ආර්ථික සහන සපයා ඇත. ඒ යටතේ ප්‍රතිලාභීන් 73,259 ක් සඳහා අස්වැසුම ප්‍රතිලාභ ලබාදීම.<br>ii. අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ | | | **100%** |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | පිළිබඳව තැකීමකින් තොරව සියලු දෙනාගේ සමාජ ආර්ථික සහ දේශපාලනික අන්තර්කරණය සවිබලගැන්වීම සහ ප්‍රවර්ධනය කිරීම. | | අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක ජාතික ඒකාබද්ධතාව ප්‍රවර්ධනය කිරීමේ විශේෂ ව්‍යාපෘති (ආන්තීකරණයට ලක්වූ කාන්තා මූලික පවුල් ආර්ථිකව සවිබල ගැන්වීම, ආන්තීකරණයට ලක් වූ පාසල් දරුවන් සවිබල ගැන්වීම හා පුනරුත්ථාපනය වූ පුද්ගලයින් සහ මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිව සිට පුනරුත්ථාපනය වූ තරුණ තරුණියන් සහ ජීවනෝපාය සංවර්ධනය) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හරහා සෑම වර්ෂයකදීම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් සිදුකරනු ලබයි. | | | |
| 11 | 11.1 2030 වන විට සියලුම දෙනාට ආරක්ෂාකාරී සහ අඩු මිළට ලබා ගත හැකි නිවාස සහ මූලික සේවාවන් වෙත ප්‍රවේශය තහවුරු කිරීම සහ පැල්පත් නිවාස වැඩිදියුණු කිරීම.<br><br>11.2 විශේෂයෙන්ම අවදානමට ලක් විය හැකි තත්ත්වයේ සිටින කාන්තාවන්, ළමුන්, ආබාධ සහිත පුද්ගලයින්, සහ වයස්ගත පුද්ගලයින්ට විශේෂ අවධානය යොමු කරමින් මහාමාර්ගවල ආරක්ෂාව ඉහළ නැංවීම, පොදු ප්‍රවාහන පද්ධති සැලකිය යුතු මට්ටමින් ව්‍යාප්ත කිරීම මගින් 2030 වන විට සියලුම දෙනාට ආරක්ෂාකාරී අඩු මිළට ලබා ගත හැකි ප්‍රවේශ විය හැකි සහ තිරසර ප්‍රවාහන පද්ධති ලබා දීම.<br>11.4 ලෝකයේ ස්වාභාවික සහ සංස්කෘතික උරුමයන් රැකගැනීම හා ආරක්ෂා කරගැනීම සඳහා වූ ප්‍රයත්නයන් ශක්තිමත් කිරීම. | නගර සහ ජනාවාස පරිපූර්ණ, ආරක්ෂිත, සවිමත් සහ තිරසර ලෙස සකස් කිරීම**.** | i. නැවත පදිංචි කිරීමේ නිවාස ව්‍යාපෘතිය යටතේ නිවාස ව්‍යාපෘති 189ක් නිම කරන ලදී. (රු.මිලියන 0.9 නිවාස - 92, රු.මිලියන 1.5 නිවාස - 97)<br><br>ii. ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් රු. මිලියන 282.7ක වියදමින් ව්‍යාපෘති 344ක් ක්‍රියාත්මක විය.<br><br>iii. නැවත පදිංචි කිරීමේ වැඩසටහන යටතේ රු. මිලියන 71.336ක වියදමින් මාර්ග සංවර්ධන ව්‍යාපෘති 31ක් ක්‍රියාත්මක විය.<br><br>iv. ආගමික හා සංස්කෘතික අංශයේ සංවර්ධනය සඳහා රු. මිලියන 40.85ක වියදමින් ව්‍යාපෘති 58ක් ක්‍රියාත්මක කරන ලදී.<br><br>v. ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් ක්ලීන් ශ්‍රී ලංකා වැඩසටහන් 08ක් ක්‍රියාත්මක කිරීම. | | | **100%** |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | 11.5 2030 වන විට දරිද්‍රතාවෙහි සහ අවදානමට පත්විය හැකි තත්වයන්හි සිටින පුද්ගලයින් සම්බන්ධයෙන් අවධානය යොමු කරමින් ජලය මගින් සිදුවන්නා වූ විනාශයන් ද ඇතුළු ආපදාවලින් ලෝකයේ දළ දේශීය නිෂ්පාදිතයට සිදුවන සෘජු ආර්ථික හානිය සලකිය යුතු ලෙස අඩු කිරීම සහ මෙමගින් බලපෑමට හා මරණයට පත් වන පුද්ගලයින්ගේ සංඛ්‍යාව කැපී පෙනෙන ලෙස අඩු කිරීම. | | vi. දිට්වා සුළි කුණාටුව මඟින් හානියට පත් වූ ජනතාව නැවත මුල් තත්ත්වය වෙත නඟා සිටුවීම වෙනුවෙන් ආපදාවන්ට ලක්වූ පවුල් වෙත රු. මිලියන 368.92 ක් ආධාර ලබාදීම. | | | |
| 12 | 12.2 2030 වන විට ස්වභාවික සම්පත් තිරසර අන්දමින් කළමනාකරණය කිරීම සහ කාර්යක්ෂමව භාවිතා කිරීම වෙත ළඟා වීම. | තිරසර පරිභෝජන සහ නිෂ්පාදන රටාවන් සහතික කිරීම. | i. දිස්ත්‍රික් කෘෂිකර්ම අංශය, අන්තර් පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සහ අනෙකුත් ආශ්‍රිත ආයතන හරහා තිරසර ගොවිතැන් හා නිෂ්පාදන ක්‍රම සහ පසු අස්වනු හානි අවම කිරීමේ ක්‍රම අනුගමනය කිරීමට ගොවීන් දැනුවත් කරන ලදී. | | | **100%** |
| 13 | 13.1 සියලුම රටවල කාලගුණය සම්බන්ධ විපත් සහ ස්වභාවික ආපදාවලට ඔරොත්තු දීමේ සහ එවැනි තත්වයන්ට මුහුණ දීමේ හැකියාව ශක්තිමත් කිරීම.<br><br>13.3 කාලගුණ වෙනස්වීම අවම කිරීම, ඒ අනුව හැඩගැසීම, බලපෑම අවම කිරීම සහ පූර්ව අනතුරු සම්බන්ධයෙන් අධ්‍යාපනය, දැනුවත්භාවය ඉහළ නැංවීම සහ මානව සහ ආයතනික ධාරිතාවන් ඉහළ නැංවීම. | දේශගුණික විපර්යාස හා ඒවායේ බලපෑම්වලට එරෙහිව කඩිනමින් ක්‍රියාත්මක වීම. | i. 2025 නොවැම්බර් මස ඇතිවූ දිට්වා සුළි කුණාටුව සහ ගංවතුර තත්ත්වය තුළ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ කාර්ය මණ්ඩලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල කාර්යය මණ්ඩලය, ආපදා කළමනාකරණ ඒකකයේ කාර්ය මණ්ඩලය, ශ්‍රී ලංකා පොලීසිය, යුධ හමුදාව සහ අනෙකුත් වගකිවයුතු නිලධාරීන් ගංවතුරින් විපතට පත් ජනතාව සඳහා සහන සැළසීමට විශාල කාර්යභාරයක් ඉටු කරන ලදී.<br><br>ii. දිස්ත්‍රික්කයේ ආපදා අවම කිරීමේ ව්‍යාපෘති 03ක් රු. මිලියන 8.67ක වියදමින් ක්‍රියාත්මක කිරීම.<br><br>iii. ii) ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය හා වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ඒකාබද්ධ ජල පෝෂක හා ජල සම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය (IWWRMP) හා CResMPA | | | **100%** |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | | ව්‍යාපෘතිය යටතේ වැව් අලුත්වැඩියා හා ඉදිකිරීම් කටයුතු සිදුකරන ලදී.<br><br>iv. සුළු වාරිමාර්ග යටතේ ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් රු. මිලියන 53.385ක් වැයකර ව්‍යාපෘති 43ක් ක්‍රියාත්මක කරන ලදී. | | | |
| 14 | 14.1 2025 වන විට සමුද්‍රීය අපද්‍රව්‍ය සහ පෝෂක දූෂණය වීම ද ඇතුළුව විශේෂයෙන්ම ගොඩබිම් පදනම් කරගත් ක්‍රියාකාරකම් මගින් සිදුවන සියලුම ආකාරයේ සමුද්‍ර දූෂණය වැළැක්වීම සහ සැලකිය යුතු මට්ටමින් අවම කිරීම.<br>14.2 2020 වන විට ආපදාවන්ට ඔරොත්තු දීමට සවිබල ගන්වමින් සහ සෞඛ්‍යවත් සහ ඵලදායීතාවෙන් යුක්ත වන ආකාරයට සාගර යථා තත්ත්වයට පත් කරමින් සමුද්‍රීය සහ වෙරළබඩ පරිසර පද්ධති තිරසර අන්දමින් කළමනාකරණය කිරීම සහ ආරක්ෂා කිරීම.<br><br>14.5 2020 වන විට හොඳම විද්‍යාත්මක තොරතුරු සහ ජාතික සහ අන්තර්ජාතික නීතිවලට අනුකූලව වෙරළබඩ සහ සමුද්‍රීය ප්‍රදේශවලින් 10% ක් සංරක්ෂණය කිරීම.<br><br>14.7 2030 වන විට තිරසර ලෙස ධීවර සම්පත්, ජලය ආශ්‍රිත සංස්කෘතිය සහ සංචාරක කර්මාන්තය කළමනාකරණය හා තිරසර අන්දමින් සමුද්‍රීය සම්පත් භාවිතා කරමින් සංවර්ධනය වෙමින් පවත්නා කුඩා දිවයින් රාජ්‍යවලට සහ අවම වශයෙන් සංවර්ධනය වී ඇති රටවලට ලැබෙන ආර්ථික ප්‍රතිලාභ වර්ධනය කිරීම. | තිරසාර සංවර්ධනය සඳහා සාගර, මුහුදු සහ සාගර සම්පත් සංරක්ෂණය සහ පිරිමැසුම්දායී භාවිතය | i. මේ යටතේ වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව, සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය හා ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව සමඟ එක්ව සමුද්‍රීය පරිසරය හා වෙරළසන්න පරිසර පද්ධතිය සුරක්ෂිත කිරීමටත්, ධීවර සම්පත් හරහා රටට හිමිවන ආර්ථික ප්‍රතිලාභ සංවර්ධනය කිරීමටත් විවිධ වැඩසටහන් හා ව්‍යාපෘති සිදුකරන ලද අතර වෙරළ ඛාදනය වැළැක්වීමට කල්මුණ ප්‍රදේශයේ මුහුදු වෙරළ ආශ්‍රිතව ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ලදී.<br><br>ii. පොතුවිල් ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ රු. මිලියන 9.43ක වියදමින් බ්ලූ ෆ්ලැග්ෂිප් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලදී.<br><br>iii. තිරසර සංවර්ධනය තුළින් සංචාරක ආකර්ෂණය ඉහල නැංවීම සඳහා රාජ්‍ය ආයතන, රාජ්‍ය නොවන සංවිධාන සහ විවිධ පෞද්ගලික ආයතන මගින් පානම වෙරළ තීරය ආශ්‍රිතව විවිධ ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ලදී.<br><br>iv. පොතුවිල් - ආරුගම්බේ සංචාරක කලාපය ආශ්‍රිතව වීදි පහන් සවි කිරීම. | | | **100%** |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 15 | 15.1 2020 වන විට භූමියේ සහ ගොඩබිම අභ්‍යන්තරයේ පවත්නා මිරිදිය පරිසර පද්ධති සහ ඒවායින් ලැබෙන්නා වූ සේවාවන්, විශේෂ වනාන්තර, කඳු සහ වියළි බිම් අන්තර්ජාතික ගිවිසුම්වලට අනුකූල වන පරිදි සංරක්ෂණය, නැවත නගාසිටුවීම සහ තිරසර අන්දමින් භාවිතා කිරීම තහවුරු කිරීම.<br>15.2 2020 වන විට සියලුම වර්ග වල වනාන්තර තිරසර අන්දමින් කළමනාකරණය කිරීම ප්‍රවර්ධනය, වන විනාශය නැවත්වීම, විනාශ වූ වනාන්තර යථා තත්වයට පත්කිරීම සහ ජගත් මට්ටමින් වන රෝපණය සහ නැවත වන වගාව වර්ධනය කිරීම. | භූගෝලීය පරිසර පද්ධතීන්ගේ තිරසර භාවිතය, තිරසර වනාන්තර කළමනාකරණය, කාන්තාරීකරණයට එරෙහිව ක්‍රියා කිරීම, ප්‍රතිස්ථාපනය කර ආරක්ෂා කර ප්‍රවර්ධනය කිරීම, ඉඩම් හායනය නැවැත්වීම සහ පුනරුත්ථාපනය කර ආරක්ෂා කළ ප්‍රවර්ධනය කිරීම, ඉඩම් හායනය නැවැත්වීම සහ පුනරුත්ථාපනය සහ ජෛව විවිධත්ව විනාශය නැවැත්වීම. | i. ක්ලීන් ශ්‍රී ලංකා වැඩසටහනට සමගාමීව ප්‍රාදේශීය ලේකම් කාර්යාල සහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය පදනම කරගනිමින් පාරිසරික වැඩසටහන් පැවැත්වීම.<br>ii. අම්පාර වැව් රක්ෂිතයෙහි බහුවාර්ෂික ශාක සිටුවීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම. | | | **100%** |
| 16 | 16.3 සියලුම දෙනාට නීතියේ සාධාරණත්වය ලබා ගැනීමට හැකි සහ අන්තර්ජාතික මට්ටමින් නීතියේ ආධිපත්‍යය ප්‍රවර්ධනය කිරීම.<br>16.5 සියලුම ආකාරයේ අල්ලස සහ දූෂණ කැපී පෙනෙන ලෙස අඩු කිරීම.<br>16.6 සියලුම මට්ටම්වලදී වගවීමෙන් යුක්ත සහ විනිවිදභාවයෙන් යුත් ආයතන පිහිටුවීම.<br>16.9 උපත් ලියාපදිංචි කිරීම ද ඇතුළුව 2030 වන විට සියලු දෙනාටම නීතිමය අනන්‍යතාවයක් ලබා දීම.<br>16.10 ජාතික නීති පද්ධතියට සහ අන්තර්ජාතික ප්‍රඥප්තීන්, ගිවිසුම්වලට අනුකූලව මහජනතාවට තොරතුරු ලබා ගැනීමට ඇති අයිතිය තහවුරු කිරීම සහ මූලික නිදහස ආරක්ෂා කිරීම තහවුරු කිරීම. | තිරසාර සංවර්ධනය සඳහා සාමකාමී සහ පරිපූර්ණ සමාජයන් ඇති කිරීම, යුක්තිය සඳහා සැමට අවස්ථාව ලබාදීම සහ සෑම මට්ටමකම එලදායී, වගකීම් සහිත පරිපූර්ණ ආයතන ගොඩනැගීම. | i. සෑම තරාතිරමකම ඵලදායී, වගකියන සහ විනිවිද පෙනෙන පරිදි ආයතන සංවර්ධනය කරමින් දූෂණය සහ අල්ලස වැලැක්වීම සඳහා අවශ්‍ය සියළු ක්‍රියාමාර්ග ගැනීම සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය තුළ අභ්‍යන්තර කටයුතු ඒකක ස්ථාපිත කිරීම.<br>ii. අලුත උපන් බිලිඳුන්ගේ උප්පැන්න ලියාපදිංචිය ඔවුන් ඉපදී මාස 3ක් ඇතුළත අවසන් කර අප්‍රමාදව උප්පැන්න සහතික නිකුත් කිරීම.<br>iii. තොරතුරු දැනගැනීමේ පනත යටතේ ඉල්ලුම්කරනු ලබන තොරතුරු කිසිදු ප්‍රමාදයකින් තොරව ලබාදීම. | | | **100%** |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 17 | 17.1 බදු සහ වෙනත් ආදායම් එක්රැස් කිරීම් වර්ධනය කිරීම සඳහා සංවර්ධනය වෙමින් පවත්නා රටවලට අන්තර්ජාතික සහයෝගය ලබා දීම ඇතුළුව දේශීය සම්පත් සජීවීකරණය.<br><br>17.8. 2017 වන විට අවම වශයෙන් සංවර්ධනය වී ඇති රටවල් සඳහා තාක්ෂණ බැංකු හා විද්‍යාව තාක්ෂණය හා නවෝත්පාදන ධාරිතාවන් ගොඩනැංවීමේ යාන්ත්‍රණ පූර්ණ වශයෙන් ක්‍රියාත්මක කිරීම සහ විශේෂයෙන් තොරතුරු තාක්ෂණ හා සන්නිවේදන තාක්ෂණයන්හි නව තාක්ෂණය භාවිතා කිරීම වැඩිදියුණු කිරීම. | තිරසාර සංවර්ධනය සඳහා ගෝලීය සහයෝගීතාවය ක්‍රියාත්මක කල හැකි විධි ක්‍රම හා නව පණගැන්වීම් ශක්තිමත් කිරීම. | i. පරිසර හිතකාමී තාක්ෂණය භාවිතයෙන් නව නිෂ්පාදන සිදුකිරීම සඳහා පුද්ගලයින් දිරිමත් කිරීමට විවිධ වැඩසටහන් පවත්වන ලදී.<br><br>ii. විවිධ දේශීය හා විදේශීය රාජ්‍ය නොවන සංවිධාන වලින් ලද ආධාර ග්‍රාමීය ජනතාවගේ පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා යොදවන ලදී.<br><br>iii. ප්ලාස්ටික් හා පොලිතීන් වෙනුවට ආදේශක ලෙස මැටි, වේවැල් වැනි ස්වභාවික ද්‍රව්‍ය භාවිත කරමින් පරිසර හිතකාමී නිෂ්පාදන සිදුකිරීම පිළිබඳව දිස්ත්‍රික් කුඩා ව්‍යාපාර සංවර්ධන අංශයේ නිලධාරීන් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයීය නිලධාරීන් විසින් ග්‍රාමීය ව්‍යවසායකයින් දැනුවත් කරන ලදී.<br><br>iv. විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය විසින් රු. 113,000.00 ක වියදමින් විදාතා වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම. | | | **100%** |

**5.2** ළඟා කරගත් තිරසර සංවර්ධන ඉලක්ක ළඟා කර ගැනීම හා එහිදී මුහුණ දුන් අභියෝග කෙටියෙන් විස්තර කරන්න.

තිරසර සංවර්ධන ඉලක්ක ළඟාකර ගැනීමේදී පහත සඳහන් අභියෝගයන්ට මුහුණ දීමට සිදුවිය.

1. අත්‍යාවශ්‍ය ඖෂධ හා වෛද්‍ය උපකරණ සපයා ගැනීමේ අපහසුතාව

2. දිට්වා සුළි කුණාටුව සහ එමඟින් ඇතිවූ ගංවතුර තත්ත්වය වැනි අයහපත් කාලගුණික තත්ත්වයන් හේතුවෙන් දිස්ත්‍රික්කයේ ජනතාවගේ වාසස්ථාන අහිමි වීම, ගමනාගමන පද්ධති බිඳවැටීම, අස්වනු හානි වීම, අධ්‍යාපන කටයුතු අඩාල වීම ඇතුළු විශාල දුෂ්කර තත්ත්වයන් ඇතිවීම.

3. උක්ත ස්වභාවික ව්‍යසන තත්ත්ව හේතුවෙන් දිස්ත්‍රික්කයේ ජනතාවගේ ආදායම් තත්ත්වය අඩුවීම හා දෛනික අවශ්‍යතා සපුරා ගැනීම සඳහා පෝෂ්‍යදායී ආහාර සපයා ගැනීමේ අපහසුතාව ආදි දුෂ්කරතා රැසකට මුහුණ දීම.

නමුත් උක්ත සියළු අභියෝග මධ්‍යයේ වුවද අපේක්ෂිත ඉලක්ක සපුරා ගැනීමට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සමත් විය.

**06 පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ**

06.1 **සේවක සංඛ්‍යා කළමනාකරණය**

| # | අනුමත සේවක සංඛ්‍යාව | පවතින සේවක සංඛ්‍යාව | ඇබෑර්තු / (අතිරික්තය) | |
|---|---|---|---|---|
| | | | ඇබෑර්තු | අතිරික්තය |
| ජ්‍යෙෂ්ඨ | 98 | 74 | 24 | |
| තෘතීයික | 76 | 42 | 34 | |
| ද්විතියික | 1914 | 2428 | 122 | 636 |
| ප්‍රාථමික | 257 | 233 | 25 | 1 |
| **එකතුව** | **2345** | **2777** | **205** | **637** |

06.2 **ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයට බලපෑම**

ජ්‍යෙෂ්ඨ හා තෘතීයික නිලධාරීන්ගේ පුරප්පාඩු, මෙම දිස්ත්‍රික්කයේ සිටින නිලධාරීන් යොදවා ගෙන ඒ ඒ රාජකාරී ආවරණය කිරීම සිදුකරනු ලබයි. එබැවින් නිලධාරීන් විසින් ආවරණය කළ යුතු රාජකාරී පරාසය පුළුල් වී ඇත. ප්‍රාථමික නිලධාරීන්ගේ පවතින පුරප්පාඩු මෙම දිස්ත්‍රික්කයේ සිටින නිලධාරීන් යොදවා ගෙන අදාළ රාජකාරී ආවරණය කර ගැනීම සිදුකරනු ලබයි.

06.3 **මානව සම්පත් සංවර්ධනය**

| අනු අංකය | වැඩසටහනේ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | වැඩ සටහනේ කාල සීමාව | සමස්ථ ආයෝජනය (Rs'000) | | වැඩසටහන ේ ස්වභාවය (දේශීය/ විදේශීය) | නිමැවුම/ලබා ගත් දැනුම* |
|---|---|---|---|---|---|---|---|
| | | | | දේශීය | විදේශීය | | |
| 01 | රියදුරු ආකල්ප සහ වෘත්තීය දැනුම ඉහළ නැංවීම | 45 | 2025.02.24 | 28,440.00 | | දේශීය | රියදුරු ආකල්ප සහ වෘත්තීය දැනුම ඉහළ නැංවීම |
| 02 | ග්‍රාම නිලධාරී සඳහා පැය 90 පුහුණුව | 6 | 2025.02.24 – 2025.03.18 | 50,970.00 | | දේශීය | ග්‍රාම නිලධාරී සඳහා විෂය දැනුම සංවර්ධනය |
| 03 | ග්‍රාම නිලධාරීන් සඳහා දෙදින පුහුණුව | 243 | 2025.06.05 – 2025.06.19 | 225,260.00 | | දේශීය | ග්‍රාම නිලධාරී සඳහා විෂය දැනුම සංවර්ධනය හා මහජන ගැටළු විසදීම |
| 04 | කළමනාකරණ සේවා නිලධාරී සේවාරම්භක පුහුණුව | 21 | 2025.09.08 – 2025.09.12 | 80,295.00 | | දේශීය | කළමනාකරණ සේවා නිලධාරී සඳහා විෂය දැනුම ලබා දීම |
| 05 | ප්‍රසම්පාදනය දෙදින පුහුණුව | 100 | 2025.09.26/27 | 216,875.00 | | දේශීය | ප්‍රසම්පාදන විෂය පිළිබඳ දැනුම යාවත්කාලීන වීම |
| 06 | ආදයම් බදු ලේඛන උඩුගත කිරීමේ පුහුණුව | 62 | 2025.10.17 | 72,400.00 | | දේශීය | ආදායම් බදු ලේඛන උඩුගත කිරීම |
| 07 | PL කාණ්ඩයේ නිලධාරීන් සඳහා වන දෙදින පුහුණුව | 107 | 2025.10.23/24 | 107,650.00 | | දේශීය | නිලධාරී ආකල්ප සහ වෘත්තීය දැනුම ඉහළ නැංවීම |

**07. පරිච්ඡේදය – අනුකූලතා වාර්තාව**

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 1 | **පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ** | | | |
| 1.1 | වාර්ෂික මූල්‍ය ප්‍රකාශ | අනුකූල වේ | | |
| 1.2 | රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම | අනුකූල වේ | | |
| 1.3 | ව්‍යපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්) | - | | |
| 1.4 | ගබඩා අත්තිකාරම් ගිණුම් | - | | |
| 1.5 | විශේෂ අත්තිකාරම් ගිණුම් | - | | |
| 1.6 | වෙනත් | - | | |
| 2 | **පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ.445)** | | | |
| 2.1 | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.2 | පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.3 | විගණන විමසුම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.4 | අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.5 | සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙලකර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 2.6 | චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.7 | ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.8 | තොග ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.9 | හානි පාඩු ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.10 | බැරකම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 2.11 | උප පත්‍රිකා පොත් ලේඛනය (GA – N20) යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 03 | **මූල්‍ය පාලනය සඳහා කාර්යන් අභිනියෝජනය කිරීම (මු.රෙ. 135)** | | | |
| 3.1 | මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරාදී තිබීම | අනුකූල වේ | | |
| 3.2 | මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම | අනුකූල වේ | | |
| 3.3 | සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරාදී තිබීම | අනුකූල වේ | | |
| 3.4 | 2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම | අනුකූල වේ | | |
| 4 | **වාර්ෂික සැලසුම් සකස් කිරීම** | | | |
| 4.1 | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.2 | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.3 | වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.4 | වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 4.5 | වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | | |
| 5 | **විගණන විමසුම්** | | | |
| 5.1 | විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම | අනුකූල වේ. | | |
| 6 | **අභ්‍යන්තර විගණනය** | | | |
| 6.1 | මු.රෙ. 134(2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 6.2 | සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම | අනුකූල වේ | | |
| 6.3 | 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 6.4 | මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 7 | **විගණන හා කළමනාකරණ කමිටු** | | | |
| 7.1 | DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම | අනුකූල වේ | | |
| 8 | **වත්කම් කළමනාකරණය** | | | |
| 8.1 | අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිල දී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 8.2 | ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තාකර තිබීම | අනුකූල වේ | | |
| 8.3 | රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 8.4 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම | අනුකූල වේ | | |
| 8.5 | ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම | අනුකූල වේ | | |
| 9 | **වාහන කළමනාකරණය** | | | |
| 9.1 | සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 9.2 | වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම | අනුකූල නොවේ | අයිතිය දිස්ත්‍රික් ලේකම් සතු නොවීම | පවරා ගැනීමට ලේඛණ ඉදිරිපත් කර ඇති බැවින් අනුමැතිය ලද පසු අපහරණය කිරීමට කටයුතු කිරීම |
| 9.3 | වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 9.4 | සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103,104,109, හා 110 ප්‍රකාරව කටයුතු කිරීම | අනුකූල වේ | | |
| 9.5 | 2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම | අනුකූල වේ | | |
| 9.6 | කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම. | අනුකූල වේ | | |
| 10 | **බැංකු ගිණුම් කළමනාකරණය** | | | |
| 10.1 | නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 10.2 | සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |
| 10.3 | බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |
| 11 | **ප්‍රතිපාදන උපයෝජනය** | | | |
| 11.1 | සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම | අනුකූල වේ | | |
| 11.2 | මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එලඹීම | අනුකූල වේ | | |
| 12 | **රජයේ නිළධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්** | | | |
| 12.1 | සීමාවන්ට වලට අනුකූල වීම. | අනුකූල වේ | | |
| 12.2 | හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම | අනුකූල වේ | | |
| 12.3 | වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |
| 13 | **පොදු තැන්පත් ගිණුම** | | | |
| 13.1 | කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම. | අනුකූල වේ | | |
| 13.2 | පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 14 | **අග්‍රිම ගිණුම** | | | |
| 14.1 | සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම. | අනුකූල වේ | | |
| 14.2 | මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම. | අනුකූල වේ | | |
| 14.3 | මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම. | අනුකූල වේ | | |
| 14.4 | අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම. | අනුකූල වේ | | |
| 15 | **ආදායම් ගිණුම** | | | |
| 15.1 | අදාළ රෙගුලාසි වලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම. | අනුකූල වේ | | |
| 15.2 | රැස් කර තිබූ ආදයම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම. | අනුකූල වේ | | |
| 15.3 | මු.රෙ 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | | |
| 16 | **මානව සම්පත් කළමනාකරණය** | | | |
| 16.1 | අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම. | අනුකූල වේ | | |
| 16.2 | කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබාදී තිබීම. | අනුකූල වේ | | |
| 16.3 | 20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | | |
| 17 | **මහජනයා වෙත තොරතුරු ලබා දීම.** | | | |
| 17.1 | තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීනකර පවත්වාගෙන යාම. | අනුකූල වේ | | |
| 17.2 | ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම. | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 17.3 | තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 18 | **පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම.** | | | |
| 18.1 | අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම. | අනුකූල වේ | | |
| 18.2 | එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම. | අනුකූල වේ | | |
| 19 | **මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම** | | | |
| 19.1 | 2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම | අනුකූල වේ | | |
| 19.2 | කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නො අඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම | අනුකූල වේ | | |
| 19.3 | ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම | අනුකූල නොවේ | 2023.11.30 දිනැති අංක 02/2018(I) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය මඟින් කාර්ය සාධන ගිවිසුම් සකස් කිරීම අවලංගු කර ඇත. | |
| 19.4 | ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම | අනුකූල වේ | | |
| **20** | **විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම** | | | |
| 20.1 | ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම | අනුකූල වේ | | |

**අවසානය.**